සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 57 - නාට්‍ය හා රංග කලාව

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

Department of Examinations - Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021 (2022)

## 57 - නාට්‍ය හා රංගකලාව

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

## ලකුණු දීමේ පටිපාටිය

## I පත්‍රයේ අභිමතාර්ථ

පෙරදිග රටවල නාට්‍ය හා රංගකලාව පිළිබඳ මූලධර්ම හා නිර්දිෂ්ට නාට්‍ය පෙළ පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.
මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්තය.

**I පත්‍රය ලකුණු බෙදීයාම**

**I කොටස -** බහුවරණ ප්‍රශ්න 40කි. නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුරට එක් ලකුණ බැගින් පිළිතුරු 40ට මුළු ලකුණු සංඛ්‍යාව 40 කි.

**II කොටස -** A හා B යනුවෙන් කොටස් දෙකකි. A හා B යන කොටස් දෙකෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න 04කට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

A හා B යන කොටස් දෙකෙහි ඇති සෑම ප්‍රශ්නයක්ම ව්‍යුහගත ආකාරයට සකස් කොට ඇත.

- එක් ප්‍රශ්නයකට අදාළ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 15 කි.
- පිළිතුරු සඳහා හිමිවන මුළු ලකුණු 15 x 4 = 60

I කොටස හා II කොටසේ A හා B යන කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් II පත්‍රය සඳහා මුළු ලකුණු 40 + 60 = 100 කි.

Department of Examinations - Sri Lanka

# ලකුණු දීමේ පටිපාටිය
# II පත්‍රයේ අභිමතාර්ථ

අපරදිග රටවල නාට්‍ය කලාව පිළිබඳ මූලධර්ම හා නිර්දිෂ්ට නාට්‍ය පෙළ පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමත් මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.

මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය.

## II පත්‍රය ලකුණු බෙදීයාම

I කොටස - බහුවරණ ප්‍රශ්න 40 කි. වඩාත් නිවැරදි පිළිතුරට එක් ලකුණ බැගින් මුළු ලකුණු 40 කි.

II කොටස - A හා B යනුවෙන් කොටස් දෙකකි. එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය. සෑම ප්‍රශ්නයක් ම ව්‍යුහගත ආකාරයට සකස් කොට ඇත.

- එක් ප්‍රශ්නයකට අදාළ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 15 කි.
- පිළිතුරු සඳහා හිමිවන මුළු ලකුණු 15 x 4 = 60

I කොටස හා II කොටසේ A හා B යන කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් II පත්‍රය සඳහා මුළු ලකුණු 40 + 60 = 100 කි.

Department of Examinations - Sri Lanka

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................................... √ △ $\frac{4}{5}$
...........................................................
...........................................................

(ii) ........................................................... √ △ $\frac{3}{5}$
...........................................................
...........................................................

(iii) ........................................................... √ △ $\frac{3}{5}$
...........................................................
...........................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ......................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** කලාව පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කලාව දෙවියන් ගේ නිර්මාණයකි.
(2) කලාව පිළිබඳ විවිධ නිර්වචන පැවතිය ද පොදු එකඟතාවක් නැත.
(3) කලාව හා ශිල්ප වශයෙන් කෙරෙන වර්ගීකරණයට පදනමක් නැත.
(4) ස්වභාව සෞන්දර්යය හා කලාව යනු එක ම දෙයකි.
(5) සියලු ම කලා මුළුමනින් ම දෘෂ්ටිගෝචර ය. (.........)

**2.** පාරිභෝගික භාණ්ඩවලට කලාත්මක ලක්ෂණ එකතු කරනුයේ,
(1) ලලිත කලාවේ දී ය. (2) ව්‍යවහාරික කලාවේ දී ය. (3) ජනප්‍රිය කලාවේ දී ය.
(4) ගැමි කලාවේ දී ය. (5) ප්‍රාකෘතික කලාවේ දී ය. (.........)

**3.** ප්‍රාසංගික කලාවක ප්‍රේක්ෂකයා හා සෘජු ව සම්බන්ධ වන්නේ කුමක් ද?
(1) චතුර් අභිනය (2) රංගාලෝකය (3) වේශ භූෂණය
(4) ප්‍රතිචාරය (5) සංගීතය (.........)

**4.** නිෂ්පාදකයකුට නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කිරීමේ දී මඟ පෙන්වන මූලික අංගය කුමක් ද?
(1) සංවාද (2) අංක සහ ජවනිකා (3) චරිත
(4) භාෂාව (5) රංග විධාන (.........)

**5.** සාත්ත්වික අභිනය අවම වශයෙන් ප්‍රකට කෙරෙන නර්තනය කුමක් ද?
(1) උඩරට (2) පහතරට (3) මණිපුරි
(4) භරත නාට්‍යම් (5) කථක් (.........)

**6.** "සර්වාංගය වෙවුලීම" නම් සාත්ත්වික අභිනය හඳුන්වන සංස්කෘත පදය කුමක් ද?
(1) ස්වේද (2) වේපථු (3) අශ්‍රු (4) ප්‍රලය (5) ස්වරභංග (.........)

**7.** ආංගික අභිනයට අයත් **නොවන** අංගය තෝරන්න.
(1) චාරී (2) ස්ථානක (3) අංග රචනා (4) හස්ත (5) කරණ (.........)

**8.** නාට්‍යයක චරිතයක් බාහිර ව සමාරෝප ගැන්වීමේ දී වඩාත් වැදගත් වන්නේ කුමක් ද?
(1) රංග රීතිය (2) අභිනය (3) පසුතලය (4) වේෂභූෂණය (5) රංගාලෝකය (.........)

Department of Examinations - Sri Lanka

9. නාට්‍යයක ප්‍රේක්ෂාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) නාට්‍ය දර්ශනය පුරා වෙනසට භාජනය වේ.
(2) පසුතල හා රංගෝපකරණ බහුල ව යෙදීම ප්‍රේක්ෂාව යි.
(3) ප්‍රේක්ෂාව වෙනස් වන්නේ නාට්‍යධර්මී සම්ප්‍රදායේ පමණි.
(4) නාට්‍යමය ක්‍රියාවට ප්‍රේක්ෂාවෙන් අනුබලයක් නො ලැබේ.
(5) ප්‍රේක්ෂක ආකර්ෂණය රඳවාගැනීමට හේතු වේ. (.........)

10. ලෝකධර්මී නාට්‍යයක පසුතලය වෙනස් කිරීමට බහුල ව යොදන නාට්‍යෝපක්‍රමය වන්නේ,
(1) ආලෝකය නොනිවා පසුතල මාරු කිරීම යි.
(2) සීනුව නාද කිරීම යි.
(3) නළු-නිළියන් සියලු දෙනා වේදිකාවෙන් පිටවීම යි.
(4) තිරය වසා දැමීම යි.
(5) රංගභූමිය අඳුරු කිරීම යි. (.........)

- ප්‍රශ්න අංක **11** සිට **15** දක්වා ප්‍රශ්න සඳහා කරුණු/සංකල්ප/නාම පහක් බැගින් සපයා ඇත. එම කට්ටලයේ ඇති **නොගැළපෙන** පදය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. (1) වකි (2) හිමොතෙ (3) සුර
(4) කගුර (5) කිරි (.........)

12. (1) ගිදයු (2) නගඋත (3) තයිකො
(4) නොකිවසු (5) කියොමොතො (.........)

13. (1) පද්මකෝෂ (2) අර්ධචන්ද්‍ර (3) ත්‍රිපතාක
(4) අපවාරිත (5) පතාක (.........)

14. (1) දිනතර (2) ස්වර්ණතිලකා (3) හරිස්චන්ද්‍ර
(4) රොමලින් (5) පරාභව (.........)

15. (1) ආලවක දමනය (2) සන්නියකුම (3) පූනාමඩු
(4) රටයකුම (5) කොහොඹා කංකාරිය (.........)

16. හරිම බඩු හයක් නාට්‍යය කුමන රංග රීතියකට අයත් ද?
(1) යථාර්ථවාදී (2) සංකේතවාදී (3) ආඛ්‍යාන
(4) අසම්මත (5) ප්‍රකාශනවාදී (.........)

17. මූදු පුත්තු නාට්‍යයේ මුල් කෘතිය නිෂ්පාදනය වූ රට කුමක් ද?
(1) ඉතාලිය (2) ඇමෙරිකාව (3) ප්‍රංශය
(4) ජර්මනිය (5) ස්පාඤ්ඤය (.........)

18. හෙන්රි ජයසේන ගේ ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය කුමක් ද?
(1) හුණුවටයේ කතාව (2) අපට පුතේ මගක් නැතේ (3) මකරා
(4) පළිගු ඇන (5) දිරිය මව හා ඇගේ දරුවෝ (.........)

19. දීපාවලී උත්සවයේ නරකාසුර හා සටන් කොට ජය ලබන්නේ කුමන දෙවියා ද?
(1) දුර්ගා (2) ශිව (3) විෂ්ණු
(4) ලක්ෂ්මී (5) ස්කන්ද (.........)

20. දෙමළ නාට්‍ය ප්‍රභේද අතර රංග කලාප වැඩි සංඛ්‍යාවක ප්‍රචලිත නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
(1) මකිඩි (2) තෙන්මෝඩි (3) වඩමෝඩි
(4) විලාසම් (5) කූත්තු (.........)

21. කාමන් කුත්තු රඟ දැක්වෙන්නේ කිනම් ආගමික උත්සවයක් ආශ්‍රිතව ද?
(1) මහාශිව රාත්‍රිය (2) විජයතසමි (3) නවරාත්‍රි
(4) තිරුවිලා (5) දීපාවලී (.........)

22. ලුඩොවයික් නිෂ්පාදනය කළ මොලියේ ගේ 'ද ඉමැජිනරි ඉන්වැලිඩ්' (The Imaginary Invalid) නාට්‍යයට දුන් සිංහල නාමය කුමක් ද?
(1) කපුවා කපෝති (2) ඉබේ වෙදා (3) මඟුල් ප්‍රස්තාව
(4) මුදලාලිගේ පෙරළිය (5) යන්තම් ගැලවුණා (.........)

Department of Examinations - Sri Lanka

23. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාවේ පුරෝගාමී අධ්‍යක්ෂවරයා කවුද?
(1) ඊ. එෆ්. සී. ලුඩොවයික් (2) නියුමාන් ජුබාල් (3) රූඩී කොරන්ස්
(4) ලේ ස්මිත් (5) අර්නස්ට් මැකින්ටයර් (.........)

24. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළ 'ද ලයන් කිං' (The Lion King) නාට්‍යයේ අධ්‍යක්ෂවරයා කවුද?
(1) රෙජි සිරිවර්ධන (2) ඉන්ද්‍ර ධර්මසේන (3) රිචඩ් ද සොයිසා
(4) ජෙරොම් ද සිල්වා (5) රූවන්ති ද චිකේරා (.........)

25. ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගායනාවලින් පමණක් ඉදිරිපත් වේ.
(2) රඟ දැක්වෙන්නේ දූවේ හා මීගමුවේ පමණි.
(3) ජේසුතුමා කුරුසපත් කිරීම ප්‍රතිමාවක් අනුසාරයෙන් රඟ දැක්වේ.
(4) නූතන පාස්කු නාට්‍ය රූකඩ අනුසාරයෙන් රඟ දැක්වේ.
(5) පාස්කු නාට්‍ය සඳහා පිටපතක් භාවිත නො කෙරේ. (.........)

26. යාග භූමියේ සැරසිල්ලක් ලෙස පිල්ලු වීදියක් නිර්මාණය කරන්නේ කුමන ශාන්තිකර්මයේ ද?
(1) රටයකුම (2) මහසොහොන් සමයම (3) සූනියම් යාගය
(4) කිරිමඩුව (5) සන්නියකුම (.........)

27. රිද්දි යාගයේ දී මූලික ව පූජාවට පාත්‍ර වන්නෝ කවරහු ද?
(1) රට යක්කු (2) රිද්දි බිසෝවරු (3) මහාබ්‍රහ්මයා
(4) කිරිමව්වරු (5) දීපංකර බුදුහු (.........)

28. වස්දොස් නිවාරණය පිණිස පවත්වනු ලබන ශාන්තිකර්මය කුමක් ද?
(1) පූනාමඩුව (2) ගිනිමඩුව (3) දෙවොල් මඩුව
(4) ගම්මඩුව (5) හැල්ලුම්මඩුව (.........)

29. පූර්වරංගයක් හා අපරරංගයක් සහිත ගැමි නාටකය කුමක් ද?
(1) සොකරි (2) නාඩගම් (3) කෝලම්
(4) මකීඩි (5) කාමන්කූත්තු (.........)

30. සොකරි ගැමි නාටකය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දිවයිනේ සෑම පළාතක ම රඟ දැක්වේ.
(2) මනා ව සැකසූ අත් පිටපතක් ඇත.
(3) චරිත බහුල ව යොදාගැනේ.
(4) දැව වෙස් මුහුණු භාවිත කෙරේ.
(5) අනුකරණය හා අනුරූපණය බහුල ව යෙදේ. (.........)

31. ශ්‍රී ලංකාවේ රඟ දක්වා ඇති පැරණිතම 'නාඩගම' කුමක් ද?
(1) ඉයුජින් (2) සිංහලේ (3) හරිස්චන්ද්‍ර
(4) රොලීනා (5) සුලම්බාවතී (.........)

32. සී. දොන් බස්තියන් ගේ නාට්‍ය පමණක් අන්තර්ගත වරණය කුමක් ද?
(1) නලරාජ චරිතය, අලකේශ්වර චරිතය, ලියොනයින් හා එමලින්
(2) රොමලින්, සිංහබා, ස්වර්ණතිලකා
(3) සෝෂක, දස්කොන්, දිනතර
(4) පණ්ඩුකාභය, මානාභරණ, සිරිසඟබෝ
(5) නලරාජ චරිතය, අලිබබා, පරංගි හටන (.........)

33. 'නෝ' වේදිකාවක 'කගමි ඉත' යනු කුමක් ද?
(1) ප්‍රධාන වේදිකාව (2) කැටපත් කාමරය
(3) වාදක කණ්ඩායම වාඩිවන ස්ථානය (4) පසුතලයේ ඇති පයිනස් ගසක චිත්‍රය
(5) සෝපාන පේළිය (.........)

34. 'ජිදයිමොනෝ' නම් කබුකි නාට්‍ය ප්‍රභේදයට අදාළ කරුණක් අන්තර්ගත වරණය කුමක් ද?
(1) නැටුම් ප්‍රමුඛ නාට්‍ය (2) පහත් පෙළේ චරිත අන්තර්ගත නාට්‍ය
(3) ඉහළ පෙළේ චරිත අන්තර්ගත නාට්‍ය (4) ගේෂා චරිත අන්තර්ගත නාට්‍ය
(5) ඓතිහාසික පුවත් ඇතුළත් නාට්‍ය (.........)

Department of Examinations - Sri Lanka

**35.** අභිඥානශාකුන්තලයේ සිවුවන අංකය ආරම්භයේ එන විෂ්කම්භකයට සහභාගී වන චරිත වන්නේ

(1) අනසූයා සහ ප්‍රියංවදා ය. (2) ශිෂ්‍යයින් දෙදෙනා ය.
(3) ශිෂ්‍යයා සහ අනසූයා ය. (4) ශිෂ්‍යයා සහ ප්‍රියංවදා ය.
(5) ගෞතමී සහ කාශ්‍යප ය. (.........)

**36.** "සිඳලිය නොහෙන අඳුරක් වෙද දිනිදු හට
මැඩලිය හැකිය ඒ නිසඳුර නිරිඳු හට"

අභිඥානශාකුන්තලයේ එන පූර්වෝක්ත පද්‍යයේ 'නිසඳුර' යනු කුමක් ද?

(1) දුර වැඩි බව (2) රජු ගේ ආචාර්යවරයා
(3) රාත්‍රි අඳුර (4) රජු ගේ සතුරෙක්
(5) චන්ද්‍රයා (.........)

**37.** මහාකවි කාලිදාස විශිෂ්ටත්වයක් ප්‍රදර්ශනය කළේ කුමන කාව්‍ය ලක්ෂණය අරබයා ද?

(1) පද ලාලිත්‍යය (2) ව්‍යංග්‍යාර්ථය
(3) අර්ථ ගෞරවය (4) උපමා
(5) වක්‍රෝක්ති (.........)

**38.** හෙන්රි ජයසේන ගේ කුවේණි නාට්‍යයේ දඩයක්කරුගේ චරිතය රඟපෑ නළුවා කවුද?

(1) විජේරත්න වරකාගොඩ (2) ෆීලික්ස් ප්‍රේමවර්ධන
(3) හෙන්රි ජයසේන (4) සැන්ටින් ගුණවර්ධන
(5) විජය නන්දසිරි (.........)

**39.** "ලෝක ඉතිහාසයේ මිනිසුන්ගේ ගල් මුගුරු පාර කාල මැරුණු මුල් ම පව්කාරිය තමා කුවේණි." කුවේණි නාට්‍යයේ මෙසේ පවසන්නේ කවුද?

(1) I නීතිඥයා (2) දිසාලා
(3) II නීතිඥයා (4) ජීවහත්ත
(5) දඩයක්කරු (.........)

**40.** කුවේණි කතා පුවත අන්තර්ගත ඓතිහාසික **නොවන** මූලාශ්‍රය කුමක් ද?

(1) මහාවංසය (2) රාජාවලිය
(3) දීපවංසය (4) ජාතක පොත
(5) වංසත්ථප්පකාසිනිය (.........)

* *

Department of Examinations - Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

විෂය අංකය / பாட இலக்கம் : **57 - I**

විෂයය / பாடம் : **නාට්‍ය හා රංග කලාව I**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය වினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 4 | 31. | 3 |
| 02. | 2 | 12. | 3 | 22. | 2 | 32. | 2 |
| 03. | 4 | 13. | 4 | 23. | 1 | 33. | 4 |
| 04. | 5 | 14. | 3 | 24. | 4 | 34. | 5 |
| 05. | 1 | 15. | 1 | 25. | 3 | 35. | 1 |
| 06. | 2 | 16. | 1 | 26. | 5 | 36. | 3 |
| 07. | 3 | 17. | 5 | 27. | 2 | 37. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 1 | 38. | 2 |
| 09. | 1 | 19. | 3 | 29. | 3 | 39. | 5 |
| 10. | 5 | 20. | 5 | 30. | 5 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

Department of Examinations - Sri Lanka

# නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

## II කොටස

## A කොටස

1. (i) සංස්කෘත නාට්‍ය කලාවේ රූපක ප්‍රභේද **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) අභිඥානශාකුන්තලය අයත් වන ප්‍රභේදය නම් කොට, එය එකී ප්‍රභේදයට අයත් වීමට හේතු වන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) අභිඥානශාකුන්තලයේ නායක, නායිකා චරිත පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 06 යි.)

(1.) (i) නාටක, ප්‍රකරණ, නාටිකා, ඩිම, සමවකාර, භාණ, ප්‍රහසන, ව්‍යායෝග, ඊහාමෘග, උත්සෘෂ්ටිකාංක, වීථි

***(යන ඒවායින් කවර හෝ හතරක් නම් කොට තිබේ නම් සම්පූර්ණ ලකුණු 04 පිරිනමන්න.)***

(ii) එකී ප්‍රභේද අතුරින් අභිඥානශාකුන්තලය අයත් වන්නේ නාටක නම් ප්‍රධාන රූපක ප්‍රභේදයට ය. එහි ප්‍රධාන ලක්ෂණ වන්නේ

(අ) ප්‍රඛ්‍යාත (ප්‍රසිද්ධ කතාවක් මත පදනම් වීම)

(ආ) එහි නායකයා රජ කෙනකු හෝ දෙවියකු විය යුතුය. ඔහු දෙවියෙක් නම් මිනිසෙකු සේ හැසිරිය යුතු ය. රජ යන්නට රාම වැනි ක්ෂත්‍රියකු ද ඇතුළත් කළ හැකි ය.

(ඇ) ඔහු ධීරලලිත ගණයට අයත් විය යුතු යැයි නාට්‍ය ශාස්ත්‍රය පවසන නමුදු මාලවිකාග්නිමිත්‍රය හැරුණු කොට අන් සියලු ම නාටකවල නායකයා වශයෙන් නිරූපිත ව ඇත්තේ ධීරෝදාත්ත හා ධීරෝද්ධත යන චරිත වර්ග ය.

(ඈ) නායිකාව මුග්ධා, කුලස්ත්‍රී හා දිව්‍යගණිකා (අප්සරා) යන තිදෙන ගෙන් එක් අයකු විය යුතු ය.

(ඉ) වෘත්ති සතරම අඩංගු විය යුතු ය.

(ඊ) ශෘංගාර, කරුණ හා වීර යන රසයන් ගෙන් එකක් ප්‍රධාන විය යුතු ය. අවසානයේ දී අද්භූත රසය උද්දීපනය විය යුතු ය.

(උ) අංක සංඛ්‍යාව 5-10 අතර විය යුතුය.

අභිඥානශාකුන්තලය මේ සියලු ම ලක්ෂණයන් ගෙන් අනූන ය. එය මහාභාරතයේ ආදිපර්වයේ එන ශකුන්තලෝපාඛ්‍යානය මත පදනම් ව ඇත. එහි සඳහන් දුෂ්‍යන්ත ගේ පුත් භරත ගෙන් භාරතීයයන් පැවතෙන බව විශ්වාස කැරෙන හෙයිනි. එහෙත් කාලිදාස එම නීරස කථාව සුන්දර නාට්‍යයක් බවට පත් කිරීමට බොහෝ වෙනස්කම් සිදු කොට ඇත. නාට්‍යයේ නායකයා වන දුෂ්‍යන්ත රජ කෙනෙකි. ඔහු අයත් වන්නේ ධීරෝදාත්ත නම් සාම්ප්‍රදායික චරිත වර්ගයට ය.

මෙහි ප්‍රධාන වෘත්තිය භාරතී වුව ද අනෙකුත් වෘත්ති සතර ද මද වශයෙන් දක්නට ඇත. උදාහරණ වශයෙන් විදූෂක පෙනීසිටින ස්ථාන හා පස් වැනි අංකයේ අලුත් උද්‍යාන පාලිකාවන් ගේ රඟපෑම් කෛශිකී වෘත්තිය ද, සවැනි අංකය අවසානයේ මාතලි විදූෂකට අඩත්තේට්ටම් කිරීම ආරභටී වෘත්තිය ද සවැනි අංකය පුරා ම දුෂ්‍යන්ත ගේ හැසිරීම සාත්ත්වතී වෘත්තිය ද ප්‍රකට කරයි. මෙයින්

Department of Examinations - Sri Lanka

උද්දීපනය වන මුඛ්‍ය රසය ශෘංගාර වුව ද කරුණ රසයෙන් ද අනූන ය. සත් වැනි අංකය අවසානයේ දුෂ්‍යන්ත හට ශකුන්තලා මුණ ගැසීම ද මරීච හා දාක්ෂිණ්‍යා සිටින දර්ශනය ද අද්භූත රසය කුලු ගන්වයි. එහි අංක සංඛ්‍යාව සතකි.

***(ලකුණු 05)***

(iii) නායක නායිකා චරිත පිළිබඳ විග්‍රහයක්

නායකයා :

ශකුන්තලෝපාඛ්‍යානයේ නිරූපිත දුෂ්‍යන්ත රජ තමන්ගේ කාර්යය කෙසේ හෝ ඉටු කරගන්නා අවස්ථාවාදියකු මෙන් ම තමන් අතින් දූෂණය වූ ශකුන්තලා ලෝකයා ඉදිරියේ ප්‍රතික්ෂේප කරන්නට තරම් දරුණු වූ දුර්ජන ගති ප්‍රකට කරන්නෙකි. එහෙත් කාලිදාස ඔහු ප්‍රේක්ෂකයාගේ සිත් ඇදගන්නා උදාර චරිතයක් බවට පත් කොට ඇත. මේ සඳහා ඔහු දුර්වාසස් සෘෂිවරයාගේ චරිතය ප්‍රබල ලෙස යොදාගනී. ප්‍රථම අංකයේ ම කාලිදාස දුෂ්‍යන්ත රජු ඉතා නිහතමානී තවුසනට ගරු කරන රජ කෙනකු ලෙස නිරූපණය කරයි. ඔහු තවුසා ගේ ඉල්ලීම පරිදි සිය ඊතලය ආපසු ඇද ගැනීමෙන් පළ කරන නිහතමානිත්වය අගය කළ තවුසා ඔහුට ඔහු මෙන් ම ගුණ යහපත් මතු සක්විති රජ කෙනෙකු වන්නා වූ පුතු රුවනක් ලැබේවායි ආශීර්වාද කෙරේ. හෙතෙම එය පිළිගනී. නාට්‍යයේ බීජය එය යි. එය පැල වී අතු පතර දරා නාට්‍යය අවසානයේ මල් පල දරයි.

පස් වැනි අංකයේ රාජ සභාවේ දී ඔහු ශකුන්තලා ප්‍රතික්ෂේප කරන්නේ ඇය ඉතා සුන්දර කාන්තාවක වුව ද (දුර්වාසස්ගේ ශාපය නිසා ඔහුට ඇය සම්පූර්ණයෙන් ම අමතක වී ඇති හෙයිනි.) අනුන්ගේ බිරියන් පිළිගැනීම පාප කර්මයකැ යි ඔහු සිතන හෙයිනි. එහෙත් සවැනි අංකය ආරම්භයේ දී ශකුන්තලා අතින් නැති වූ පේරැස් මුදුව දැකීමෙන් ඔහුට යළි සිහි වූ ශකුන්තලා දැකගත නොහැකි ව ඇගේ චිත්‍රයක් ඇඳ එමගින් ඇය සමග සම්බන්ධකම් පත් වන්නට යත්න දරන අහිංසක පෙම්වතකු සේ නිරූපිත ය. එසේ ම ඔහු අනුනට අයත් කිසි ම දෙයක් ලබාගන්නට උත්සාහ නො දරයි. මියගිය කෙළෙඹියාට දරුවන් නොසිටි හෙයින් ඔහු සතු සියලු ධනය රාජ සන්තක කළ හැකි වුව ද, ඔහුගේ බිරියන් ගේ කවරකුට හෝ දරුවකු සිටී දැයි සොයා බලන ලෙස අණ කරයි.

සත් වැනි අංකයේ ඔහුට ශකුන්තලා හා පුතු සම්භ වීමෙන් පසු ලබන ප්‍රීතිය නිම්හිම් නැත. ශකුන්තලා සිය දරුවා ද සමග ස්වකීය පුත්‍රයා කැටුව මාරීච සෘෂිවරයා වෙත යන්නට ලජ්ජා වෙද්දී මෙවැනි අවස්ථාවක එසේ කළ යුතු ය කියමින් සිය බිරිඳත් දරුවාත් සමග සෘෂිවරයා වෙත යයි.

නායිකාව :

ශකුන්තලෝපාඛ්‍යානයේ ශකුන්තලා වූ කලී තමාගේ උත්පත්තිය පිළිබඳ ව දුෂ්‍යන්ත ඉදිරියේ ප්‍රකාශ කරන්නට තරම් ලජ්ජා බියෙන් තොර, එසේම රජු හා එක් වීමට 'සිය පුතුට යුව රජකම දෙන ලෙස' කොන්දේසියක් දමන්නට තරම් එඩිතර වූ කන්‍යාවකි. එම ලක්ෂණ 'මුග්ධා' (ළඳ බොළඳ) චරිතයකට කෙසේ වත් නො ගැළපේ. එහෙත් කාලිදාස ශකුන්තලා ගේ උත්පත්තිය ගැන ප්‍රකාශ කරන්නට යොදා ගන්නේ අනසූයා ය. ඔවුන් දෙදෙනා ගේ පළමු සමු වීමේ දී දෙදෙනා අතර වචනයක් හෝ හුවමාරු නොවුව ද දෙදෙනා තුළ අන්‍යෝන්‍ය ආදරයක් ඇති විය. ඇය ගේ ප්‍රේමය අව්‍යාජ ය. ඕ සිය යෙහෙළියන් දෙදෙනාට මහත් සේ ආදරය කරයි. සෑම කටයුත්තක දීම ඔවුන්ගේ උපදෙස් පතයි. එසේ ම පරිසරලෝලියකි. සිය ගත සරසා ගන්ට එක් ගසකින් කොළයක් නොකඩා ගන්නා, ඒවාට ජලය නොදී තමන්ගේ පිපාසාව නොසන්සිඳුවා ගන්නා එසේ ම අම්මා නැති ව අසරණ වූ මුව පොව්වකු තමාගේ දරුවා ලෙස පෝෂණය කරන පරිසර ලෝලියකි.



Department of Examinations - Sri Lanka

දුෂ්‍යන්ත විසින් තමා ප්‍රතික්ෂේප කරන ලද නමුත් ඔහු හට වෛර නොකර ඔහුගේ දරුවා පෝෂණය කර ගනිමින් වත් රකිමින් අසපුවක ජීවිතය ගත කරන්නීය. ඇයට අවසානයේ දී මාරීච ආශ්‍රමයේ දී රජ හමු වූ විට ඇයට කියා ගත හැකි වූයේ 'ජය වේවා ස්වාමි පුත්‍රය' යනු පමණි. ඇගේ දෑසින් කඳුළු කඩා හැලෙන්නට විය. එවිට දුෂ්‍යන්ත පවසන්නේ 'කඳුළ ඔබේ ජය හඬ මැඩ පැවැත් වුවත්, ලකර නොකළ ඔබේ රුව දැකීමෙන් මා ජය ගත්තා' යනු ය. එසේ කියමින් හේ සිය ඇඟිල්ලෙන් ඇගේ කඳුළ පිස දමයි. මේ නාට්‍යයේ උච්චතම අවස්ථාව ය. තම ස්වාමියා හමු වී ඔහු තමන් යළි භාර ගැනීමේ ප්‍රීතිදායක ප්‍රවෘත්තිය සිය හදා වඩා ගත් කණ්ව කුලපති වෙත යන්නට ඇය තුළ ඇති වූ ආශාව මාරීච ඍෂි අතින් ඉටු වීමෙන් පසු සිය දරුවා හා ස්වාමි පුත්‍රයා සමඟ හස්තිනා පුරය බලා පිටත් වී යයි.

***(ලකුණු 06)***

2. (i) අභිඥානශාකුන්තලයේ අද්භූත රසය මතු වන අවස්ථා **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) කතා වස්තුව සමග සම්බන්ධ කරමින් එම අවස්ථා අද්භූත රසය මතු කරන්නේ කෙසේ දැ යි පෙන්වාදෙන්න. (ලකුණු 06 යි.)

(iii) දෙවන අංකය ආරම්භයේ එන විදූෂක ගේ ඒකල භාෂණයේ මතු වන රසය විවරණය කරන්න.(ලකුණු 07 යි.)

(i). අභිඥානශාකුන්තලයේ අද්භූත රසය කුලු ගැන්වෙන මුල් ම අවස්ථාව එහි පස් වැනි අංකය අවසානයේ ය. එහි දී තමාගේ විස්මෘතිය නිසා ශකුන්තලා පිළිගැනීම දුෂ්‍යන්ත තදින් ම ප්‍රතික්ෂේප කළ විට ඇය සමග ආ තවුසෝ ඇය එහි දමා ආපසු යන්නට සැරසෙති. එවිට පුරෝහිතයා දරුවා ලැබෙන තුරු ඇය තම නිවසේ තබා ගන්නට ඉල්ලූ අවසරයට රජ එකඟ වෙයි. ඒ අනුව ඇය සමඟ පිට ව යන පුරෝහිතයා මොහොතකින් යළි පැමිණ මිනිස් ස්වරූපයෙන් පැමිණි ගිනි බෝලයක් ශකුන්තලා ඔසවා ගෙන ගියා ය යන අද්භූතජනක සිදුවීම රජුට සැළ කර සිටී.

දෙවැනි වරට අපට අද්භූත රසය විඳ ගත හැකි වන්නේ සත් වැනි අංකයේ ය. එහි මුල සිට ම ඉන්ද්‍රගේ වාහනයෙන් දෙව් ලොව සිට ආපසු එන දර්ශනය අද්භූත රසය මවා පායි. එසේ ම දුෂ්‍යන්ත හට සිය පුත්‍රයා හා බිරිඳ හමු වීමත් මාරීච ඍෂිවරයා හමු වීමත් අද්භූත රසය ජනනය කරයි.

***(ලකුණු 02)***

(ii). පස් වැනි අංකය පුරා ම ශකුන්තලා දුෂ්‍යන්තගේ මතක අවදි කැරැවීමට ගත් සියලු ම උත්සාහ ව්‍යර්ථ විය. මේ නිසා ඇය අසරණභාවයට පත් වේ. ඒ අතර තවුසෝ ඇය එහි තනි කොට ආපසු යන්නට සැරසෙති. පුරෝහිතයා ඇය වෙනුවෙන් ඉදිරිපත් වන්නේ මේ අවස්ථාවේ දී ය. ඕ විලාප නගමින් පුරෝහිතයා සමඟ නික්ම යයි. දුෂ්‍යන්ත ද මහත් දෙගිඩියාවෙන් යහන් ගැබ කරා යන අතර

' පිළිකෙව් කළ මුනිදුව මා බිරිඳ බවට නැත මතකක්

එනමුඳු දැඩි සේ වද දෙන මහද පෙළයි ලෙස විස්වස් '

යනුවෙන් පවසයි. මේ අවස්ථාවේ ප්‍රේක්ෂකයන් ඇතුළු සියලු දෙනා අවුලින් අවුලට පත් වී සිටින අවස්ථාවයි. ඒ අතර පුරෝහිතයා ආපසු පැමිණ පවසන දෙයින් සියල්ලෝ විස්මයට පත් වෙති.

සත් වැනි අංකය ද අද්භූත රසයෙන් අනූන ය. දිව්‍ය ලෝකයේ සිට ආපසු එන ගමන ඉතා චමත්කාර ජනක ආකාරයෙන් සමතලා රංග පීඨය මත නිරූපණය කළ යුතු ය. සුරයන් දුෂ්‍යන්ත ගැන රචනා කරන ප්‍රශංසාත්මක ගීත, රථය බිමට අවතීර්ණ වන විට ඔවුනට පෘථිවිය දිස් වන ආකාරය වර්ණනා කරන අයුරු අතිශයින් ම චමත්කාරජනක ය. ඉන් පසු දුෂ්‍යන්ත හට සිය දරුවා



Department of Examinations - Sri Lanka

හමු වූ ආකාරය ද අද්භූත රසය දනවයි. ඔහුගේ තිබූ රක්ෂා සූත්‍රය කැඩී බිම වැටුණු පසු එය ගන්නට දුෂ්‍යන්ත සැරසෙද්දී තවුසියන් පළ කළ බිය ද අද්භූත රසය පනවයි. ඒ එය දරුවා ගේ දෙමාපියන් ද හැර අන් කවරකුට හෝ අල්ලන්නට අකැප බව පැවසීමෙනි.

එසේම මාරීච ඍෂිවරයා පිළිබඳ වර්ණනාව ද අද්භූත රසය කුලු ගන්වයි. ඉන් පසු දුෂ්‍යන්ත ශකුන්තලා හා දරුවා පිළිගනිමින් මහර්ෂි දෙපළ ඔහුට ආශීර්වාද කිරීමත්, වෛදික චාරිත්‍ර අනුව ඔවුන් දෙදෙනාගේ විවාහෝත්සවය පැවැත්වීමෙන් නාට්‍ය අවසානයට පැමිණේ. මෙසේ නාට්‍යයක් අවසානයේ අද්භූත රසය කුලු ගැන්විය යුතු බවට භරත කරන ප්‍රකාශය සැබෑ කිරීමට කාලිදාස සාර්ථක උත්සාහයක් දරා ඇත.

(ලකුණු 06)

(iii) කාලිදාස ස්වකීය නාටකවල විදූෂක චරිතයේ භාවිතය ක්‍රමයෙන් හීන කළ බවක් පෙනේ. ඔහුගේ මුල් කෘතිය වන මාලවිකාග්නිමිත්‍රයේ කෞශිකී නම් බෞද්ධ මෙහෙණිය ද සමග අග්නිමිත්‍ර-මාලවිකා සම්බන්ධය වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කරයි. ඔහුගේ දෙවැනි නාට්‍ය වන වික්‍රමෝර්වශීයෙහි විදූෂකගේ කාර්යභාරය ඊට වඩා අඩු කොට ඇත්තේ ශෘංගාර රසයට අමතර ව කරුණ රසය ද එහි ප්‍රබල නිසා ය. උර්වශිය අතුරුදහන් වීමෙන් පසුව පුරූරවස් පිස්සකු මෙන් ඇය සොයා වනය දෙවනත් කරන්නේ විදූෂක නොමැති ව තනි ව ම ය. අභිඥානශාකුන්තලයෙහි විදූෂක යොදනු ලැබ ඇත්තේ අංක දෙකක පමණි. එනම් දෙවනි හා හය වැනි අංකයේ ය. දෙවැනි අංකයේ ඉතිවෘත්තිය වර්ධනයෙහිලා විදූෂක විශේෂ මෙහෙවරක් ඉටු කරයි. රජ වාසල මුළුතැන්ගෙහි බෙහෙවින් රුඳුණු ඔහුට දැන් දුෂ්‍යන්ත ගත කරන වන ජීවිතය එපා වී ඇත. එහෙයින් දෙවැනි අංකය පුරා ම ඔහු උත්සුක වන්නේ ස්වකීය මිත්‍රයා ශකුන්තලා නිසා ප්‍රිය කරන කැලෑ ජීවිතයෙන් ඔහු ඉවත් කර ගැනීමට ය. එහිලා දෙවැනි අංකය ආරම්භ කරමින් ඔහු කරන ඒකල භාෂණය වැදගත් තැනක් දරයි. එම කතාවෙන් විදූෂකගේ සම්පූර්ණ චරිත ලක්ෂණ ඉස්මතු කොට ඇත. ඔහු බඩජාරී පුද්ගලයෙකි. මාලිගාවේ දී බිසෝවරුන්ගෙන් ඔහුට ලැබෙන කෑම බීම, විශේෂයෙන්ම රස කැවිලි, ඔහුට මහත් ආස්වාදයක් ගෙන දේ. ඒවා නැතිව පලහාගත් දඩ මස් කමින් කොළ පිරි කැකෑරෙන උල්පත් ජලය පානය කරමින් රජු ගත කරන මේ ජීවිතය කුමක් ද? එයට හේතුව ළඟදී රජුට මුණ ගැසුණු ශකුන්තලා නම් තාපස කන්‍යාව බව හේ දනී. දවස පුරා වන සතුන් පසු පස එළවමින් වෙහෙසී ඔහුගේ හන්දිපත් රුදාව හට ගෙන ඇත. එහෙයින් ඔහුට අවශ්‍ය තමාගේ වෙහෙස නිවා ගැනීමට සුළු විවේකයක් ලබා ගැනීමට ය. එහෙයින් රජු පැමිණීමට පෙර ඔහු කරන මේ ඒකල භාෂණය භරත පවසන පරිදි ත්‍රිවිධ හාස්‍යය කුලු ගන්වයි. ඔහුගේ අංග හාස්‍යය එනම් බාහිර පෙනුම කොහොමටත් හාස්‍ය ජනක ය. තමාට සිදු වී ඇති අකරතැබ්බය ප්‍රකාශ කිරීමට ඔහු භාවිත කරන වාංමාලාවත්, ඉදිරිපත් කරන විලාසයත් අප ඉදිරියේ මැවී පෙනේ. මහ දහවල ඔන්න ඌරෙක් ඔන්න මුවෙක් ඔන්න ගෝනෙක් කිය කියා කෑ ගසමින් දුවලා තමාගේ හන්දි පත් කෙටී ඇත. ඒ මදිවට කොරේ පිටට මරේ කීවා මෙන් රජුට දැන් මුණ ගැසී ඇත ශකුන්තලා. දැන් ඔහුට අගනුවර බලා යන්නට කොහොම වත් උනන්දුවක් නැත. ඒ නිසා රජු එන විට අතපය කැඩුණා වගේ හිටගෙන ජය වේවායි පවසන්නේ අතින් කර පෙන්වීමට අපහසු නිසා ය. ඒ නිසා විදූෂකගේ මෙම ඒකල භාෂණය ත්‍රිවිධ අංගයන් ගෙන් පෝෂණය වූ පිරිසිදු හාස්‍යය රසයක් ලබා දේ.

(ලකුණු 07)

Department of Examinations - Sri Lanka

3. (i) නෝ නාට්‍ය කලාවට අයත් මූලික චරිත වර්ග **පහක්** නම් කරන්න. (ලකුණු 05 යි.)

(ii) නෝ වේදිකා උපකරණ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) නෝ නාට්‍ය කලාවේ වෙස් මුහුණු භාවිතය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)

(i) SHIN (ශින්) - දෙවියා

NAN (නන්) - මිනිසා

NYO (නියෝ) - ස්ත්‍රිය

KYO (ක්යෝ) - උමතු බව

KI (කි) - යක්ෂ

***(පහක් නම් කර ඇත්නම් ලකුණු 05)***

(ii) නෝ වේදිකාව මත උපයෝගී කරගන්නා උපකරණ වර්ග 03කි.

- වේදිකාව මත රඳවන ලද වේදිකා උපකරණ (ත්සුකුරි මොනෝ)
- නළුවා විසින් අතින් දරා සිටින කුඩා වේදිකා උපකරණ (කෝ-දෝගු)
- විවිධ කාර්යයන් සඳහා උපයෝගී කර ගනු ලබන වේදිකා උපකරණ (තයෝ-දෝගු)

මෙම සියලු වේදිකා උපකරණ සරල සැහැල්ලු ලෙස නිර්මාණය කෙරෙන අතර රෙදි හා බට පතුරු ඊට උපයෝගී කරගනී. පූජාසනය, යහන, පාලම, ප්‍රාසාදය ආදිය නිරූපණයේ දී අඩි තුනක් පළල අඩි හයක් දිග රෙද්දකින් ආවරණය කරන ලද ඍජුකෝණාස්‍රාකාර රාමු භාවිතයට ගෙන ඇත.

ඊට අමතර ව අත් භාණ්ඩ වන කඩු, කස, සීනු, කැටපත්, අවාන් ආදිය ස්වාභාවික ප්‍රමාණයට සමීප උපකරණ ලෙස භාවිතයට ගැනේ. යමක් ශෛලිගත ව සංකේතාත්මක ව ඉදිරිපත් කිරීමට හැරමියට, බිලිපිත්ත. කිණිස්ස, දුනු ඊතල. පන්දම, චීන වස් දණ්ඩ, පින්සල ආදිය යොදා ගනිති.

***(ප්‍රමාණවත් පරිදි පිළිතුරු ලියා ඇති විට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. ලකුණු 05)***

(iii) නෝ නාට්‍ය කලාවෙහි ලා වෙස් මුහුණු භාවිතය සුවිශේෂී වේ. ස්ත්‍රීන් යක්ෂ හා අවතාර චරිත සඳහා වෙස් මුහුණු භාවිතා වේ. ඒවා මිනිස් මුහුණට වඩා කුඩා ය. සැහැල්ලු ලීයෙන් තනා ඇත. නෝ වෙස් මුහුණු වර්ග 120ක් පමණ වේ. පිරිමි ළමයි, තරුණයන්, ශින්තො දෙවියන්, බෞද්ධ දෙවියන්, අන්ධයන්, අද්භූත සතුන් ආදිය සඳහා පිරිමි වෙස් මුහුණු ද ස්ත්‍රීන්, තරුණියන්, මැදි වියේ ස්ත්‍රීන්, මැහැල්ලන්, වියරු ස්ත්‍රීන්, ඊර්ෂ්‍යා සහගත ස්ත්‍රීන් අදිය සඳහා ස්ත්‍රී වෙස් මුහුණු ද භාවිතා වේ.

***(මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. ලකුණු 05)***

Department of Examinations - Sri Lanka

## B කොටස

4. (i) කුවේණි නාට්‍ය රචකයා ප්‍රතිනිර්මාණය කරන කුවේණිය සහ පුරාවෘත්තයේ එන කුවේණිය අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) කුවේණි නාට්‍යයේ පළමුවැනි අංකය අවසානයේ එන

"නොහඬන් කුමරුනි - ඇවිද ළසෝගිනි
එන රජ කුමරිය ඇත එපිට සිට
ඔබ සනහාලයි - දුකඳුර දුරුකොට ..."

ගීතයෙන් නාට්‍යකරුවා ප්‍රතිනිර්මාණය කරන කුවේණිය ගේ චරිතාභ්‍යන්තරය කෙබඳු දැ යි විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) කුවේණිය නූතන අධිකරණයකට නැංවීමේ නාට්‍යකරුවාගේ අපේක්ෂාව ඔබ දකින්නේ කෙසේ දැ යි පෙන්වාදෙන්න. (ලකුණු 06 යි.)

(i) **පුරාවෘත්තයේ කුවේණිය**, යකිණියක්, මායාකාරියක්, ශාප කරන්නියක්

**නාට්‍යයේ කුවේණිය,** සදා කාලික ගැහැණියක්, සැමියාට ද්වේෂ නොකරන කාන්තාවක්. උපේක්ෂා සහගත කාන්තාවක්

***(ලකුණු 04)***

(ii) මෙම ගීතයෙන් නාට්‍යකරුවා ප්‍රතිනිර්මාණය කරන කුවේණිය පෙරදිග බෞද්ධ සංස්කෘතියෙන් හික්මවන ලද සාධාරණ කාන්තාවකි. ඇයගේ චිත්ත අභ්‍යන්තරයේ කොතෙක් දුක් ගිනි ඇවිලුණ ද ඇය තම සැමියාගේ ළසෝ ගිනි නිවීමට උත්සාහ කරන්නී ය. දුරු රටකින් එන කුමරිය හා අබිසෙස් ලැබ යහතින් දිවි ගෙවන්නට ආශීර්වාද කරන්නියක් නාට්‍ය කරුවා ප්‍රතිනිර්මාණය කර ඇත. ඇය සිය කැමැත්තෙන් ම දරුවන් ද සමග මාලිගයෙන් පිට වී යන්නී ය. ඇය එසේ යන්නේ සිය සැමියා ගේ යහපත පිණිස ය. එසේ පිට ව ගිය ද මතු සංසාරයේ කෙදිනක හෝ නැවත තම සැමියා සමඟ එක් වීමට ද ඇය ප්‍රාර්ථනා කරයි.

මේ සියලු දෙයින් අපට ගම්‍ය වනුයේ ඇයගේ සංකීර්ණ වූ චිත්ත අභ්‍යන්තරය යි. ඇය සැමියාට ද්වේෂ නොකළ ද ඇයගේ හද තුළ ඔහු පිළිබඳ ආදරයක් ඇත. තාවකාලික ව වෙන් වුව ද ඔහු සමඟ ඇති බැඳීම අත් නොහරී.

ඇය සිය දරු දෙදෙනාට අහිමි වන පිය සෙනෙහස ගැන පවා නො සිතයි. ඇය ගේ සිතැඟි අනුව ම කටයුතු කරන ආත්මාර්ථකාමී ගැහැණියක ගේ චිත්ත ස්වභාවය එයින් පෙන්වයි.

***(මේ ආකාරයට අපේක්‍ෂකයා තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරන්නේ නම් ලකුණු 05)***

(iii) කුවේණිය අධිකරණයට නැංවීමෙන් නාට්‍යකරුවා අපේක්ෂිත අරමුණු අතර

- ස්වාමියා අතහැර ගිය ගැහැණියක නැවත අධිකරණයට පැමිණ තම ස්වාමියා ඉල්ලා සිටීම
- ඇය ඉල්ලා සිටින්නේ වන්දියක් නොව ස්වාමියා ගේ සෙනෙහස යි. එයින් අදහස් කරන්නේ කාන්තාවකට අවශ්‍ය කරන්නේ භෞතික වටිනාකම නොව ආදාරය සෙනෙහස වැනි මානුෂික ගුණාංග බව යි.



Department of Examinations - Sri Lanka

- සැමියා කුමන වරදක් කළ ද බිරිඳක ගේ යුතුකම වනුයේ ඔහු කෙරෙහි ද්වේෂ සහගත නොවී සිටීම යි.

*(මෙසේ නාට්‍යකරුවා ගේ අපේක්ෂා විවිධාකාරයෙන් අපේක්ෂකයා විසින් විස්තර කර තිබිය හැකිය. ලකුණු 06)*

5. (i) බෞද්ධ විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් නාට්‍යමය ලක්ෂණ සහිත පූජාකර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ඉහත (i) සඳහා ඔබ දුන් පිළිතුරෙහි ඇතුළත් එක් පූජාකර්මයක අරමුණ, පවත්වන ආකාරය හා නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) මෙකී පූජාකර්මවල උපයෝගිතාව, වර්තමාන තත්ත්වය හා ඒවා අධ්‍යයනයෙන් ලැබෙන ඵලය ගැන ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 07 යි.)

(i)

1. දොරකඩ අස්න
2. ආලවක දමනය
3. මිලින්ද ප්‍රශ්නය
4. යුගාසන බණ

*(කරුණු දෙකකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 02)*

(ii)

**දොරකඩ අස්න**

සමාජයට සෙත් පතා පැවැත්වෙන සති පිරිත් සජ්ඣායනයෙහි අවසන් දින රාත්‍රියේ දී මහා මංගල සූත්‍රය සහ ආටානාටිය සූත්‍රය ශ්‍රවණය කිරීම සඳහා පැමිණෙන මෙන් විහාරවලට හා දේවාලයවලට අධිගෘහිත දෙවිදේවතාවුන්ට ආරාධනා කිරීම මෙහි අරමුණ යි.

දොරකඩ අස්න බෞද්ධ පූජා කර්මය පැවැත්වෙන්නේ දැනට එතරම් ප්‍රචලිත නොවන සති පිරිත් පූජාකර්මයෙහි අවසාන දිනයෙහි දී එහි අවසාන අංගය ලෙස ය.

විහාරස්ථානයෙහි දී පෙර පුහුණුවකට ලක් කළ අවුරුදු 12-14 තරම් වයස පිරිමි ළමයෙකු දේව දූතයකු නියෝජනය වන ලෙස සැරසී පැමිණේ. එවිට භික්ෂූන්වහන්සේ අවට විහාරස්ථානවල හා දේවාලයවල අධිගෘහිත දෙවිවරුන්ට ආරාධනය කිරීමේ විහාර අස්න කියවා දේවාලය තල්පත ලියාදෙයි. තල්පත් සතරක ලියූ මෙය කත් ලීයක දෙකෙළවර එල්ලාගෙන අසිපත් දැරූ දොරටුපාලයින් අට දෙනකු පිරිවරා දේවාලයට රැගෙන යයි. භික්ෂූන්වහන්සේ දෙවියන් ඉදිරියේ කරණීය මෙත්ත සූත්‍රය සජ්ඣායනය කළ පසු දේවදූතයා දේවාලය තල්පත කියවයි. අනතුරු ව තල්පත් සතරක ලියූ එම පණිවිඩය එම දේවාලයෙහි සතර කොණ එල්වා ආපසු පැමිණෙයි. අසිපත් දරන රැකවල්ලු මුර කරන කුටියක රැඳවන දේවදූතයා අනතුරු ව රාත්‍රි පිරිතට වැඩම කරන භික්ෂූන්වහන්සේ සමග පෙරහරින් පිරිත් මණ්ඩපය වෙත පැමිණෙති. එහි දී දොරටුපාලයන් ද දෙපස සිටිය දී භික්ෂූන් වහන්සේ සමග ඔහු සංවාදයක නිරත වේ. භික්ෂූන්වහන්සේ ගේ ප්‍රශ්න විචාරීමේ දී හෙතෙම සියලු දෙවිවරුන් එම ස්ථානයට පැමිණ සිටින බව ප්‍රකාශ කෙරෙන දොරකඩ අස්නෙහි පෙළ ශබ්ද නගා කියවයි.

මෙම සමස්ත ක්‍රියාවලිය තුළ ම දරුවා දේවදූතයකු ලෙස සමාරෝපය වීම, දේවදූතයකු ලෙසින් සංවාද භාවිතය, හෙතෙම දේව දූතයකු බවට හැඟවෙන පරිදි වේෂභූෂණ, අංගරචනය භාවිතය මෙන්ම

Department of Examinations - Sri Lanka

අවිගත් දොරටුපාලයන් සහ ඔවුන් ගේ අසිපත් සංකේතවත් කරන නාට්‍යෝපකරණ භාවිතය වැනි මූලික නාට්‍යමය අංග ලක්ෂණවලින් මෙන් ම දේවදූතයකු වශයෙන් සංවාද භාවිතයෙන් ද සමන්විත වේ.

**ආලවක දමනය**

ආලවක දමනය ධර්ම දේශනයෙහි දී ආලවක යක්ෂයා පිළිබඳ කතා පුවත දේශනා කිරීමේ දී එය නාට්‍යානුසාරයෙන් වඩාත් ආකර්ෂණීයව ඉදිරිපත් කිරීමේ මාර්ගයක් ලෙස මෙය භාවිත කෙරේ. මහත් බලසම්පන්න සේ පෙන්වන ආලවක යක්ෂයා අබිබවා බුදුන්ගේ බලය ජය ගැනීම ධර්ම දේශනය අතරතුර දී නාටකීය අයුරින් නිරූපණය කර පෙන්වීමෙන් ධර්ම ශ්‍රවණය කරන්නන් තුළ ඒ පිළිබඳ සිත් කාවදින ධාරණාවක් භක්තියක් ඇති කිරීම මෙහි අරමුණ වේ.

ඒකාකාරී ධර්ම දේශනා ක්‍රමය වෙනුවට එය ප්‍රාසංගික ව වඩාත් ආකර්ෂණීය ව ඉදිරිපත් කිරීමෙන් සැදැහැවතුන් ගේ ආකර්ෂණය සහ සහභාගිත්වය ඉහළ නංවා ගැනීම ද මෙහි තවත් අරමුණක් වේ.

නූර්ති, ටීටර්, චිත්‍රපට වැනි විනෝද මාධ්‍ය ප්‍රචලිත වෙමින් පැවැති සමයක පන්සලට සැදැහැවතුන් ආකර්ෂණය කරගැනීමේ උපක්‍රමයක් ලෙස මෙය ව්‍යවහාරයට පැමිණුනි.

අලව් යකු දොළොස් වසක් තිස්සේ කුඩා දරුවන් බිලිගනිමින් සිටීම නැවැත්වීම පිණිස බුදුරදුන් යකු ගේ විමානයට වැඩම කිරීමත් අනතුරු ව ඔහු හා සංවාදයේ යෙදී අවසානයේ ඔහු දමනය කිරීමත් මෙහි දී නාට්‍යානුසාරී ආකාරයට නිරූපණය කෙරේ.

මෙම ධර්ම දේශණය තුළ ආලවකයා මෙන් ම ඔහු අතවැසි ගද්‍රභයා ලෙස නළුවන් සමාරෝපය වීම, අවස්ථා නිරූපණය, ගැටුම් අවස්ථාවක් දක්නට ලැබීම, අනුකරණය, සංවාද භාවිතය, වේෂ භූෂණ, චරිත නිරූපණය, නාට්‍යෝපකරණ භාවිතය වැනි නාට්‍යමය ලක්ෂණයන්ගෙන් සමන්විත වේ.

අලව් යකු ගේ අතවැසි යකුන් ගේ බාධා කිරීම් මැඩලමින් බුදුන් වහන්සේ අලව් විමනට වැඩම වීම, ඒ බව සැළ වී කෝපාවිෂ්ට වන ආලවක යකු බුදුන් මැඩලීම පිණිස පෙරළා පැමිණීමත්, බුදුන් වහන්සේ පැරදවීමට විවිධ උපක්‍රම යෙදීමත්, අවසානයේ පරාජට පත් වන හෙතෙම තමන්ට බිලි ගැනීමට දරුවා පිරිනැමීමෙන් ලජ්ජාවට පත් වීමෙන් අනතුරු ව දරුවා බුදුන්ට පූජා කර බුදුන් සරණ යාමත් මෙහි දී නාට්‍යානුසාරී ව නිරූපිත ය.

**මිලින්ද ප්‍රශ්නය**

අභිධර්මයෙහි සඳහන් ගැඹුරු දහම් කරුණු සැදැහැවතුන්ට සරල බසින් හා ආකර්ෂණීය ලෙස පැහැදිලි කරදීම මෙහි අරමුණයි. බෞද්ධ දර්ශනයේ පවතින තාර්කික බව අවධාරණය කිරීමේ අරමුණෙන් අතීතයෙහි තර්ක ශාස්ත්‍රයෙහි විශාරදයකු වූ මිළිඳු රජු සමග එවක සුප්‍රකට භික්ෂූන් නමක් වූ නාගසේන තෙරුන් වහන්සේ සමග පැවැති තර්කානුකූල සංවාදය නාට්‍යානුසාරී ව ඉදිරිත් කිරීම මෙම පූජාකර්මයේ දී සිදු කෙරේ. මිළින්දප්පඤ්හ නැමැති සුප්‍රකට බෞද්ධ පෙළෙහි එන සංවාදය නාගසේන ස්ථවිරයන් සංකේතවත් කරන භික්ෂූන් වහන්සේ සහ මිලින්ද රජු සේ වෙස් වළාගත් ගිහියකු විසින් නිරූපණය කෙරේ.

මෙහි දී මූලික වශයෙන් ම පෙළෙහි ඇති තර්කවලට අනුකූල වන සංවාද භාවිතය, මිළිඳු රජු ලෙසින් ගිහියා සමාරෝපය වීම, මිලින්ද ප්‍රශ්නය නැමැති ධර්ම දේශන අවස්ථාව බෞද්ධ සම්ප්‍රදායෙහි දැකිය හැකි නාට්‍යානුසාරී නිරූපණයක් ලෙස හැඳින්විය හැකි ය.

Department of Examinations - Sri Lanka

**යුගාසන බණ**

බුදුදහමට අයත් වැදගත් ධර්ම කොටස් ශ්‍රාවකයන් ඉදිරියේ මධුර ස්වරයෙන් ප්‍රාසංගික ලෙස ඉදිරිපත් කිරීම මෙහි මූලික අරමුණ යි.

ධර්ම ශාලාවක් තුළ භික්ෂූන් වහන්සේ දෙනමක් ධර්ම කොටස් මාරුවෙන් මාරුවට කවි ගායනයෙන් දේශනා කිරීම හෝ ප්‍රශ්නෝත්තර මගින් දේශනා කිරීම මෙම අවස්ථාවෙහි දක්නට ලැබේ. මෙහි ඇති ප්‍රධානතම නාට්‍යමය ලක්ෂණ වන්නේ කවි ගායනය හා සංවාද භාවිතය යි.

***(මෙවැනි කරුණු විස්තර කර ඇත්නම් ලකුණු 06)***

(iii)

- ප්‍රාසංගික ලක්ෂණවලින් සමන්විත ව ඉතා ආකර්ෂණීය ආකාරයට බුදු දහමේ ගැඹුරු දහම් කරුණුවල සිට සදාචාර වටිනාකම් දක්වා අදහස් සමාජගත කිරීම සඳහා පැවැති අවශ්‍යතාව මේවායෙහි සම්භවයට බලපෑ ප්‍රධානතම සාධකය යි.

- විශේෂයෙන් නූතන ආකාරයේ ජනමාධ්‍ය පැවතුණේ නැති, සමාජයේ බහුතරයකට ලිවීමේ කියවීමේ හැකියාවන් නොපැවැති අවධියක මෙවන් උපක්‍රම ඉතා ආකර්ෂණීය වූයේ ය.

- එහෙත් මෙම පූජාකර්ම බිහි වූ යුගයට වඩා වර්තමාන සමාජය පරිවර්තනය වී ඇත.

- එකලට වඩා බොහෝ පුළුල් ශ්‍රාවක පිරිසකට වඩාත් ආකර්ෂණීය ලෙස ධර්ම ප්‍රචාරය සඳහා ද නූතන ලෝකය තුළ ඉඩ ප්‍රස්ථා වැඩි වී තිබේ. ඒවා සමග සංසන්දනය කිරීමේ දී මෙවන් පූජාකර්ම ධර්ම ප්‍රචාරය අතින් ඵලදායි නැත.

- වර්තමානයේ දී මේවා අධ්‍යයනයෙන් අද දවසේ සමාජ පරිසරයට අනුව හැඩ ගසා මෙම පූජාකර්ම සකස් කරගත හැකි ද යන්න සොයාගත හැකි ය. එවැනි අවස්ථාවල දී බුදු දහමේ මූලික වටිනාකම්වලට හානි නොවන ආකාරයට නවීන සන්නිවේදන මාර්ග පවා භාවිත කළ හැකි ආකාරය සොයා බැලිය හැකි ය.

- මේවා බිහි වූ සමාජ වාතාවරණයන් අවබෝධ කරගැනීම, ප්‍රාසංගික කලාවන් සහ ආගම අතර සම්බන්ධය පිළිබඳ කරුණු හැදෑරීම වැනි අරමුණු සඳහා ද මේවා අධ්‍යයනය ප්‍රයෝජනවත් ය.

***(මෙවැනි කරුණු හෝ මීට සමාන කරුණු දක්වා ඇත්නම් ලකුණු 07)***

**6.** (i) නාට්‍ය විචාරයේ දී සලකා බැලිය යුතු මූලික කරුණු **හයක්** නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉහත (i) ප්‍රශ්නයට ඔබ සැපයූ පිළිතුරු අතුරෙන් මුඛ්‍ය කරුණක් ගෙන එහි වැදගත්කම පහදන්න. (ලකුණු 05 යි.)

(iii) **කුවේණි** හෝ **අභිඥානශාකුන්තලය** පිළිබඳ විචාරයක් ලියන්න. (ලකුණු 07 යි.)

(i) නාට්‍ය විචාරයේ දී සලකා බැලිය යුතු මූලික කරුණු

- නාට්‍යයට පදනම් කරගත් මූලාශ්‍රය/ තේමාව/ කථා පුවත



Department of Examinations - Sri Lanka

- තේමාවේ කාලීන බව හෝ සර්වකාලීන බව
- පෙළ රචනය (භාෂාව, සංවාද, චරිත නිරූපණය, කථා වස්තුව, රංග ශෛලිය)
- නාට්‍යෝචිත අවස්ථා/ ගැටුම් අවස්ථා
- රංග කාර්යය- නළු නිළි රංගනයේ සාර්ථක අසාර්ථක බව
- ආනුෂංගික අංගවල උචිත අනුචිත බව (අංග රචනය, වේෂභූෂණ, රංගාලෝකය, රංග භූමි අලංකරණය, නාට්‍ය සංගීතය)
- නිර්මාණයේ සාධනීය ලක්ෂණ
- නිර්මාණයේ අඩු පාඩු හා දුර්වලතා
- නාට්‍යයෙන් මතු කෙරෙන අර්ථ කථනය හා රසය
- සමස්ත නිෂ්පාදනයේ සාර්ථක අසාර්ථක බව

***(ඉහත සඳහන් කරුණු 06ක් නම් කිරීම සඳහා ලකුණු 03)***

(ii) ඉහත (i) ප්‍රශ්නයට අපේක්ෂකයා සැපයූ පිළිතුරු අතුරෙන් එක කරුණක් සඳහන් කොට එහි වැදගත්කම පැහැදිලි කිරීම සඳහා

***(ලකුණු 05යි)***

(iii) කුවේණි හෝ අභිඥානශාකුන්තලය පෙළ රචනය පදනම් කරගෙන හෝ එකී නාට්‍ය වල නිෂ්පාදනය පදනම් කරගෙන විචාරය ලිවිය හැකි ය.

- නාට්‍ය පිළිබඳ හැඳින්වීමක් (රචකයා, මූලාශ්‍රය, කථා පුවත, අධ්‍යක්ෂ, වර්ගය හෝ ප්‍රභේදය)
- පෙළ රචනයේ විශේෂ ලක්ෂණ (ශෛලිය භාෂාව, සංවාද, කථා වස්තු විකාසය)
- චරිත නිරූපණය
- සමස්ත නාට්‍යයේ නිර්මාණාත්මක බව
- වත්මන් සමාජයට ඇති අදාළත්වය හෝ ආදර්ශමත් බව

***(වැනි කරුණු හෝ ඉහත (i) හි සඳහන් කරුණු විශ්ලේෂණය කොට නාට්‍ය ඇගයීමට ලක් කරමින් ලියන විචාරයක් සඳහා ලකුණු 07)***

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)**
**General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)**

**නාට්‍ය හා රංග කලාව - සිංහල II**
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

**57 S II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ...................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

- ※ **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- ※ **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

※ එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

**1.** ඇරිස්ටෝටල්ගේ 'කාව්‍යශාස්ත්‍රයේ' සඳහන් කවියකු සතු අනුකරණ විධි තුන කවරේ ද?
(1) වස්තුව, පෙළ, සංවාද
(2) ගැටුම, කූටප්‍රාප්තිය, අවප්‍රාප්තිය
(3) මාධ්‍ය, වස්තු, විධි
(4) රේඛාව, රිද්මය, තානය
(5) ලය, මාධූර්යය, නාදය (.........)

**2.** ශෝකාත්මක නාට්‍යයක ඛේදනීය වීරයා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) අතිශය යහපත් විය යුතු ය.
(2) සංගත චරිතයක් විය යුතු ය.
(3) අසාමාන්‍ය විය යුතු ය.
(4) දුර්වලකම් නොතිබිය යුතු ය.
(5) භාග්‍යසම්පන්න විය යුතු ය. (.........)

**3.** ඊස්කිලස්ගේ ඔරෙස්ටෙයියා ත්‍රෛරූපකයට අයත් නාට්‍ය තුන වන්නේ
(1) ප්‍රොමිතියස් බන්ධය, යදින්නෝ, බොයීෆොරොයි ය.
(2) තීබයට එරෙහිව සත් දෙනෙක්, බොයීෆොරොයි, යුමෙනයිඩීස් ය.
(3) පාරසිකයෝ, යදින්නෝ, යුමෙනයිඩීස් ය.
(4) අගමෙම්නොන්, බොයීෆොරොයි, යුමෙනයිඩීස් ය.
(5) යුමෙනයිඩීස්, ප්‍රොමිතියස් බන්ධය, අගමෙම්නොන් ය. (.........)

**4.** ක්‍රි.පූ. 423 දියොනීසියානු නාට්‍ය උළෙලේ ප්‍රථම ස්ථානය දිනාගත් ඇරිස්ටොෆනීස් ගේ නාට්‍යය කුමක් ද?
(1) කුරුල්ලෝ
(2) ලයිසිස්ට්‍රාටා
(3) මණ්ඩූකයෝ
(4) සාමය
(5) වලාකුළු (.........)

**5.** ග්‍රීක ශෝකාත්ම නාට්‍ය චරිතවල චිත්තාභ්‍යන්තරය හෙළි කිරීම සඳහා භාවිත කළේ කුමන නාට්‍ය උපක්‍රමයක් ද?
(1) ගායන වෘන්දය
(2) ආත්මභාෂණ
(3) ඒකල භාෂණ
(4) පණිවුඩකරු
(5) සංකේත (.........)

6. මධ්‍යකාලීන යුරෝපයේ දිව්‍ය පූජාව ආශ්‍රිත ව ප්‍රභවය වූයේ මින් කවර නාට්‍යමය අවස්ථාව හෝ නාට්‍යය ද?
   (1) මානව වර්ගයා
   (2) මිස්ටරි
   (3) මරියාවරුන් තිදෙනාගේ කතාව
   (4) රජතුන් කට්ටුව
   (5) අවසාන රාත්‍රි භෝජන සංග්‍රහය (.........)

7. ජේසුස් වහන්සේ ගේ ජීවිතය අළලා නිර්මාණය වූ නාට්‍ය අයත් වන්නේ මෙයින් කවරකට ද?
   (1) කෝපුස් ක්‍රිස්ටි
   (2) මිස්ටරි
   (3) මිරකල්
   (4) මොරැලිටි
   (5) එඬේර නාටක (.........)

8. මධ්‍යකාලීන යුරෝපයේ ශිල්ප ශ්‍රේණි අතුරෙන් බේකරිකරුවන්ට පැවරුණේ ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ කුමන සිදුවීම රංගගත කිරීමට ද?
   (1) ස්වර්ගාරෝහය
   (2) ආදම්-ඒව කතාව
   (3) කායින්-ආබෙල් කතාව
   (4) අවසන් රාත්‍රි භෝජනය
   (5) ජුදාස්ගේ පාවාදීම (.........)

9. එළිසබෙතීන නාට්‍යකරු ක්‍රිස්ටෝෆර් මාලෝ ගේ විශිෂ්ටතම කෘතිය කුමක් ද?
   (1) මෝල්ටාවේ යුදෙව්වා
   (2) දෙවැනි එඩ්වඩ්
   (3) ටැම්බලේන්
   (4) ටිමොන් ඔෆ් ඇතැන්ස්
   (5) ඩොක්ටර් ෆවුස්ටස් (.........)

10. පහත දැක්වෙන නාට්‍ය අතුරෙන් විලියම් ශේක්ස්පියර් විසින් රචිත ඓතිහාසික නාට්‍යය කුමක් ද?
   (1) III රිචඩ්
   (2) ලියර් රජ
   (3) මැක්බත්
   (4) කොරියෝලේනස්
   (5) සිම්බලින් (.........)

11. ග්‍රීක නාට්‍ය සම්මතය අනුව වේදිකාව මත රඟ දැක්විය **නොහැක්කේ** ඊඩිපස් නාට්‍යයේ කුමන අවස්ථාව ද?
   (1) යොකැස්ටා ඊඩිපස්ට දොස්නගා පිටව යාම
   (2) දූතයා යොකැස්ටා ගේ මරණය සිදු වූ ආකාරය අභිනයෙන් දැක්වීම
   (3) යොකැස්ටා මියගොස් සිටිනු ඊඩිපස් දකින අවස්ථාව
   (4) යොකැස්ටා ගේ දේහය එක්කුක්ලීමාව මත තිබීම
   (5) ඇස් අන්ධ කරගෙන සිටින ඊඩිපස් වේදිකාව මතට පැමිණීම (.........)

12. ඊඩිපස් නාට්‍යයේ ගායන වෘන්දය ඊඩිපස්ට ලායස් ගේ ඝාතකයා සොයාගැනීම පිණිස දෙන උපදේශය කුමක් ද?
   (1) දියොනීසස් දෙවියන් ගෙන් විමසන ලෙස යි.
   (2) ටෙරේසියාස් අනාගතවක්තෘ ගෙන්වා විමසන ලෙස යි.
   (3) සෙවීමෙන් කිසිදු පලක් සිදු නොවන බව යි.
   (4) ඝාතකයා කවුදැ යි ෆීබස් ඇපොල්ලෝ ගෙන් විමසන ලෙස යි.
   (5) යොකැස්ටා දේවිය ගෙන් පමණක් විමසන ලෙස යි. (.........)

13. ඊඩිපස් නාට්‍යයේ ලායස් රජු ගේ ඝාතනය ගැන විමර්ශනයක් නොකිරීමට හේතුව ලෙස ක්‍රියොන් ඉදිරිපත් කළේ කුමන කාරණයක් ද?
   (1) රට සාමකාමී ව පැවතීම යි.
   (2) ස්ෆින්ක්ස් උවදුරින් බාධා එල්ල වීම යි.
   (3) ඝාතනය දුටු එඬේරා තීබයෙන් පලා යෑම යි.
   (4) යොකැස්ටා එසේ නොකරන ලෙස ඉල්ලා සිටීම යි.
   (5) සොරමුළක් විසින් ඝාතනය සිදු කළ බව පිළිගැනීම යි. (.........)

- ප්‍රශ්න අංක **14** සිට **19** දක්වා ප්‍රශ්න සඳහා කරුණු/සංකල්ප/නාම පහක් බැගින් සපයා ඇත. එම කට්ටලයේ ඇති **නොගැළපෙන** පදය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

14. (1) ඔන්කොස්
   (2) පැරඩොස්
   (3) ඔර්කීස්ට්‍රා
   (4) ස්කීනී
   (5) පැරාස්කීනියා (.........)

15. (1) ප්‍රත්‍යාවර්තනය
   (2) ආකූලීකරණය
   (3) ප්‍රත්‍යභිඥානය
   (4) තදාත්ම්‍ය විඝටනය
   (5) අනාවරණය (.........)

16. (1) සමාජයේ කුලුණු
   (2) ජන හතුරා
   (3) වෙරි වත්ත
   (4) තරුණ සංගමය
   (5) කැටිලින් (.........)



Department of Examinations - Sri Lanka

**17.** (1) ස්වාභාවිකවාදී (2) යථාර්ථවාදී (3) ප්‍රකාශනවාදී
(4) අසම්මත (5) පිස්කැටර් (.........)

**18.** (1) අයනෙස්කෝ (2) මැක්සිම් ගෝර්කි (3) හැරල්ඩ් පින්ටර්
(4) එඩ්වඩ් ඕල්බි (5) ඇල්බෙයා කැමූ (.........)

**19.** (1) ස්ටැනිස්ලව්ස්කි (2) බ්‍රෙෂ්ට් (3) ඇන්ටන් චෙකොෆ්
(4) පිස්කැටර් (5) මෙයර්හෝල්ඩ් (.........)

**20.** ගිරාල්ඩෝ සින්තියෝ ගේ 'හෙකටම්ති' කතා එකතුවෙන් උපුටා ගත් කතාවක් සහිත ශේක්ස්පියර් ගේ නාට්‍යය කුමක් ද?
(1) රෝමියෝ ජුලියට් (2) මැක්බත් (3) කුණාටුව
(4) වැනිසියේ වෙළෙන්දා (5) ඔතෙලෝ (.........)

**21.** ජුලියස් සීසර් නාට්‍යයේ සෙනෙට් සභාවේ දී සිය සහෝදරයා නිදහස් කරගැනීම සඳහා සීසර්ට පෙත්සමක් බාර දෙන්නේ කවුද?
(1) ආර්ටිමිඩෝරස් (2) කස්කා (3) මෙටලස් සිම්බර්
(4) ලිගේරියස් (5) ඩෙසියස් බ්‍රූටස් (.........)

**22.** බ්‍රූටස් හා කැසියස් අතර ගැටුමක් හට ගන්නේ කුමන කරුණක් අරබයා ද?
(1) සීසර් ඝාතනය
(2) රෝමයෙන් පලායාමට සිදුවීම
(3) සෙබළුන් බෙදාගැනීම
(4) සටනට මුදල් රැස්කිරීම
(5) කුමන්ත්‍රණය සැලසුම් කිරීම (.........)

**23.** "නෑ! සීසර්ට එහෙම ලෙඩක් නෑ, ඒක තියෙන්නේ ඔබට යි, මට යි. මේ අවංක කස්කට යි විතර යි."
මේ ප්‍රකාශයේ ව්‍යංගාර්ථය කුමක් ද?
(1) ඔවුන් තිදෙනා ම අපස්මාරයෙන් පෙළෙන බව
(2) ඔවුන්ගේ යටහත් පහත් බව
(3) සීසර් ව්‍යාජ රෝගයක් පෙන්වූ බව
(4) තිදෙනා ම ඉතා අවංක බව
(5) සීසර් නීරෝගී බව (.........)

**24.** ඇන්ටනි හා ඔක්ටේවියස් සමග ත්‍රිත්ව පුද්ගල පාලන අධිකාරියක් ගොඩනගාගෙන සිටි සෙසු පුද්ගලයා කවරෙක් ද?
(1) ක්‍රසස් (2) පොම්පේ (3) ලෙපිඩස්
(4) බ්‍රූටස් (5) ලිගේරියස් (.........)

**25.** ඔක්ටේවියස්ගේ චරිතය ජූලියස් සීසර් නාට්‍යයට එක් වන්නේ කුමන අංකයේ දී ද?
(1) 1 අංකය (2) 2 අංකය (3) 3 අංකය
(4) 4 අංකය (5) 5 අංකය (.........)

**26.** රූකඩ ගෙදර නාට්‍යයේ ටෝවල්ඩ් ක්‍රිස්ටිනාට බැංකුවේ තනතුරක් දෙන්නේ කුමක් නිසා ද?
(1) කෘග්ස්ටාඩ් ඉවත් කිරීම අරමුණු කරගෙන ය.
(2) ඇය නූවුරා ගේ (නෝරා ගේ) මිතුරියක වීම නිසා ය.
(3) ක්‍රිස්ටිනාට සේවා පළපුරුද්දක් තිබීම ය.
(4) ක්‍රිස්ටිනා හා කෘග්ස්ටාඩ් එකෙ'කා හඳුනන බැවිනි.
(5) නූවුරා ගේ සිත රිදවීමට අකමැති නිසා ය. (.........)

**27.** රූකඩ ගෙදර නාට්‍යයේ නූවුරා පොරොන්දු පත්‍රයට පියා ගේ අත්සන වෙනුවට සිය අත්සන යොදන්නේ මන්ද?
(1) වංචා සහගත සිතිනි.
(2) ටෝවල්ඩ්ට එය කළ නොහැකි නිසා ය.
(3) කෘග්ස්ටාඩ් ගේ බල කිරීම මත ය.
(4) ක්‍රිස්ටිනා උදව් කරන බව දන්නා හෙයිනි.
(5) රෝගී පියාට අත්සන් කරන ලෙස කීමට නොහැකි බැවිනි. (.........)

Department of Examinations - Sri Lanka

**28.** රුකඩ ගෙදර නාට්‍යයේ සංකේත අතුරෙන් නූවුරා ගේ වියවුල් මානසිකත්වය පිළිබිඹු කරන ප්‍රබලතම සංකේතය කුමක් ද?
(1) ගිනි උදුන (2) නත්තල් ගස (3) තරන්තලා නැටුම
(4) සෙල්ලම් ඇඳුම (5) මැකරූන් කෑම (.........)

**29.** රුකඩ ගෙදර නාට්‍යයේ පොරොන්දු පත්‍රය ලියුම් පෙට්ටියට දැමූ බව දැනගත් ලින්ඩෙ නූවුරාට කියන්නේ කුමක් ද?
(1) කෙසේ හෝ ලියුම් පෙට්ටිය විවෘත කොට එය ගන්නා ලෙස යි.
(2) එසේ සිදුවීම හෙල්මර්ට හා නූවුරාට යහපතක් බව යි.
(3) තමා මෙය කෙසේ හෝ බේරාදෙන බව යි.
(4) කලබලයට පත් නොවී ඉන්නා ලෙස යි.
(5) නූවුරා වංචාවක් සිදුකොට ඇති බව යි. (.........)

**30.** රුකඩ ගෙදර නාට්‍යයේ එන 'ඩොමිනෝව' යනු කුමක් ද?
(1) විලාසිතා සාදවලට අඳින පිරිමි ඇඳුමකි.
(2) පිරිමින් අඳින ගමන් ඇඳුමකි.
(3) කාන්තා උතුරු සළුවකි.
(4) ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම අඳින සීත කබායකි.
(5) සාදවලට අඳින විසිතුරු කාන්තා උඩු කබායකි. (.........)

**31.** ඊඩිපස් නාට්‍යයේ ටෙරේසියස් පවසන පරිදි ඊඩිපස්ට දඬුවමක් පැනවිය හැකි එක ම පුද්ගලයා කවරෙක් ද?
(1) ක්‍රියොන් (2) දියොනීසස් (3) ඇපොල්ලෝ
(4) සියස් (5) ආටිමිස් (.........)

**32.** ඊඩිපස් නාට්‍යයේ සිවුවැනි අංකයේ රජමැදුරේ සේවකයා ඊඩිපස් හඳුනාගන්නේ කෙසේ ද?
(1) ඇපොල්ලෝ ගේ මග පෙන්වීමෙන්
(2) ලායස් මිය යාමට පෙර පැවසූ බසින්
(3) දේව අනාවැකිය මගින්
(4) ටෙරේසියස්ගේ ප්‍රකාශයෙන්
(5) දෙපාවල පැවැති විකෘතියෙන් (.........)

**33.** ඊඩිපස්ට මූලික වශයෙන් ගැටීමට සිදුවන්නේ කවරකු හෝ කවර බලවේගයක් සමග ද?
(1) ගොපල්ලා (2) ලායස් (3) දෛවය
(4) ටෙරේසියස් (5) ක්‍රෙයොන් (.........)

**34.** චරිතය හා භූමිකාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) භූමිකාව යනු චරිතය හඳුන්වන වෙනත් නමකි.
(2) චරිතයකට භූමිකා කිහිපයක් තිබිය හැක.
(3) භූමිකා හා චරිත අතර ගැටුම් පැවතිය නොහැක.
(4) චරිතයකට තිබිය හැක්කේ එක් භූමිකාවකි.
(5) නාට්‍ය විකාශයේ දී චරිතය භූමිකාවට වඩා වැදගත් ය. (.........)

**35.** නාට්‍ය නිෂ්පාදනයක් සඳහා අත්‍යවශ්‍ය **නොවන්නේ**
(1) නළු-නිළියෝ ය. (2) අධ්‍යක්ෂ ය. (3) ගද්‍ය හෝ පද්‍ය සංවාද ය.
(4) සංගීතය ය. (5) වේෂභූෂණ හා අංගරචනා ය. (.........)

**36.** අතිනාටකය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අවසානය ඛේදජනක වේ.
(2) අවසානය සුඛජනක වේ.
(3) භාවප්‍රකෝපකාරී සිදුවීම් නැත.
(4) චරිත සංඛ්‍යාව සීමිත ය.
(5) ඉබ්සන් අතිනාට්‍ය නිර්මාතෘවරයෙකි. (.........)

**37.** "An Actor Prepares" නම් කෘතිය
(1) මෙයර්හෝල්ඩ් ගේ ය. (2) ඇන්ටන් චෙකොෆ් ගේ ය.
(3) ලී ස්ට්‍රාස්බර්ග් ගේ ය. (4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ ය.
(5) ස්ටැනිස්ලව්ස්කි ගේ ය. (.........)

Department of Examinations - Sri Lanka

**38.** අසංගත (Absurd) නාට්‍ය කලාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඇල්බෙයා කැමුගේ "Myth of Sisyphus"අසංගත නාට්‍යයකි.
(2) අසංගත නාට්‍යය යනු අතිනාට්‍ය කලාව ඉදිරියට ගෙනයාමකි.
(3) ශ්‍රී ලංකාවේ අසංගත නාට්‍ය නිෂ්පාදනය වූයේ නැත.
(4) අසංගත නාට්‍ය බිහිවීමට හේතු තවමත් හඳුනාගෙන නැත.
(5) ආඛ්‍යාන රංග රීතිය හා බෙහෙවින් සමාන වේ. (.........)

**39.** නාට්‍ය විචාරයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) විචාර සිද්ධාන්ත දැන සිටීම විචාරකයකුට අවශ්‍ය නැත.
(2) නාට්‍ය විචාරය යනු රස වින්දනයට යෙදෙන වෙනත් නමකි.
(3) විචාරකයා තුළ තුලනාත්මක දෘෂ්ටියක් තිබිය යුතු ය.
(4) පෙරදිගට අදාළ පැරණි විචාර සාහිත්‍යයක් නැත.
(5) භරතමුනි ගේ නාට්‍යශාස්ත්‍රය විචාර කෘතියකි. (.........)

**40.** ළමා නාට්‍ය කලාවට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වැඩිහිටියන් ළමා නාට්‍ය රචනා නොකළ යුතු ය.
(2) වැඩිහිටි චරිත ද ළමුන් විසින් ම රඟපෑ යුතු ය.
(3) සෑම විට ම සුඛජනක ලෙස අවසන් නොවිය යුතු ය.
(4) ළමා නාට්‍ය රචකයා ළමයා ගේ දෘෂ්ටි කෝණයෙන් ලෝකය දැකිය යුතු ය.
(5) ළමා නාට්‍ය කලාව පිළිබඳ පරිචය පමණක් ප්‍රමාණවත් ය. (.........)

* *

Department of Examinations - Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)**

| විෂය අංකය<br>பாட இலக்கம் | **57 -II** | විෂයය<br>பாடம் | **නාට්‍ය හා රංග කලාව II** |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I කොටස/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 3 | 31. | 3 |
| 02. | 2 | 12. | 4 | 22. | 4 | 32. | 5 |
| 03. | 4 | 13. | 2 | 23. | 2 | 33. | 3 |
| 04. | 5 | 14. | 1 | 24. | 3 | 34. | 2 |
| 05. | 1 | 15. | 4 | 25. | 4 | 35. | 4 |
| 06. | 5 | 16. | 3 | 26. | 1 | 36. | 2 |
| 07. | 2 | 17. | 5 | 27. | 5 | 37. | 5 |
| 08. | 4 | 18. | 2 | 28. | 3 | 38. | 1 |
| 09. | 5 | 19. | 3 | 29. | 2 | 39. | 3 |
| 10. | 1 | 20. | 5 | 30. | 1 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

Department of Examinations - Sri Lanka

# II පත්‍රය
## A කොටස

1. (i) ජුලියස් සීසර් නාට්‍යයේ නාට්‍යමය ක්‍රියාවට රෝමයේ මහජනයා සම්බන්ධවන අවස්ථා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉන් **එක්** අවස්ථාවක් නාට්‍යයේ විකාසයට දක්වන වැදගත්කම ගැන විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) ජුලියස් සීසර් නාට්‍යය පදනම් කොටගෙන රටක මහජනයා හා පාලක පන්තිය අතර සම්බන්ධයේ ස්වභාවය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06 යි.)

(i)

- ආරම්භක දර්ශනය - I අංකය I දර්ශනය
- ලුපර්කල් උත්සවය - I අංකය II දර්ශනය
- ඇන්ටනී විසින් සීසර්ට ඔටුණු පළඳවනු ලබන අවස්ථාව - I අංකය
- සීසර්ගේ අවමඟුල - III අංකය

***(අංක සහ දර්ශන නම් කර තිබීම අත්‍යවශ්‍ය නොවේ. ලකුණු 03)***

(ii)

- සීසර්ට විරුද්ධ බලවේගයක් ගොඩ නැගෙමින් පවතින බව.
- රෝමයේ සාමාන්‍ය මහජනයාට පාලක පන්තියේ ක්‍රියා කලාපය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බැවින් අවශ්‍ය විටක ඔවුන් පාවිච්චි කළ හැකි බව.
- පාලකයන් මහජනයා ඉදිරියේ කරන රඟපෑම ඔටුණු පැළඳීමෙන් නිරූපණය වේ. විජිගීෂාවෙන් පෙළෙන සීසර් අධිරාජ පදවිය අපේක්ෂාවෙන් සිටින මුත් මහජනයා ඉදිරියේ ඔටුන්න තෙවරක් ප්‍රතික්ෂේප කිරීමෙන් තමා තුළ බලයට කිසිදු ආශාවක් නැති බව පෙන්වයි. නාට්‍යයේ සීසර්ගේ චරිතය හා මහජනයාගේ භූමිකාව නාට්‍ය විකාසයට වැදගත් වේ.
- සීසර්ගේ අවමඟුලේ දී ඇන්ටනී පවත්වන දේශනය මහජනයා කුපිත කරවීමෙහි ලා සමත් වෙයි. එය නාට්‍ය විකාසයේ තීරණාත්මක අවස්ථාවකි. කුමන්ත්‍රණය සාර්ථක වුව ද කුමන්ත්‍රණකරුවන්ට බලය නො ලැබේ. මහජනයා කුපිත කොට ඔවුන්ව පළවා හැරීමට ඇන්ටනී ඇතුළු පිරිස සමත් වෙති.

***(ලකුණු 06)***

(iii) පාලක පන්තියට මහජනයා ප්‍රයෝජනවත් වන්නේ බලයට පත්වීම උදෙසා ය. රජයේ ආදායමින් මහජනයා නඩත්තු කිරීම, මුදල් බෙදීම, වතු පිටි උද්‍යාන සෑදීම ආදියෙන් ඔවුන් තෘප්තිමත් කිරීම හා ඒ මගින් පාලකයනට පක්ෂග්‍රාහී පිරිසක් ගොඩ නගා ගැනීම. (ඒ සඳහා අනුග්‍රහය පාලකයා ගේ අරමුණ යි.)

ජුලියස් සීසර් නාට්‍යයේ ආරම්භක දර්ශනයේ සීසර් පිළිගැනීමට ප්‍රීති ඝෝෂා නගමින් සිටින මහජනතාව දැක්වේ. ඔවුන් ඒ ආකාරයට ම පොම්පේ වෙනුවෙන් ද සතුට පළ කර ඇත. මෙයින් පෙනෙන්නේ රටක බහුතර ජනතාව වර්තමාන වීර චරිතය වටා එක් රෝක් වන බවයි.

සීසර් ඝාතනය කොට බ්රූටස් රට පිළිබඳ හැඟීම් බර දේශනයක් පවත්වන විට මහජනතාව

Department of Examinations - Sri Lanka

ඔල්වරසන් හඬ දෙයි. මොහොතකින් ඇන්ටනිගේ උපක්‍රමශීලී කතාවෙන් ද ඔවුන් මහත් උද්දාමයට පත් වේ. මෙයින් පෙනෙන්නේ පාලකයින් හෝ පාලකයින් වෙන්නට සිටින අයගේ කපටි හැඟීම් බර කථාවලට මහජනතාව නිතර රැවටෙන බවයි.

පාලකයින් උපක්‍රමශීලීව බලයට ඒමට සහ බලය තහවුරු කර ගැනීම සඳහා විචාරශීලී නොවන බහුතර ජනතාව පොළඹවා ගන්නා ආකාරය ජූලියස් සීසර් නාට්‍යය ඇසුරෙන් පෙන්වා දිය හැකි ය.

***(අපේක්ෂකයා තම අදහස් තර්කානුකූල ව ඉදිරිපත් කර ඇති ආකාරය සලකා බලා ලකුණු දෙන්න***

***ලකුණු 06)***

2. (i) ඊඩිපස් චරිතයේ දුර්වල ලක්ෂණ **දෙකක්** පෙන්වා දෙන්න. (ලකුණු 04 යි.)
   (ii) ඊඩිපස් නාට්‍යයේ සාර්ථකත්වයට එකී ලක්ෂණ හේතුවන ආකාරය විමසන්න. (ලකුණු 05 යි.)
   (iii) ඊඩිපස් චරිතයේ නායක ලක්ෂණ ගැන ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06 යි.)

(i)

- දැඩි ආත්ම විශ්වාසය
- ක්ෂණික කෝපය

***(කරුණු දෙක ම ලියා ඇති විට ලකුණු 04)***

(ii) දැඩි ආත්ම විශ්වාසය හේතුවෙන් ලායස් රජු ගේ ඝාතකයා සොයන බව සියල්ලන් ඉදිරියේ සපථ කර සිටී. ඒ අරමුණ කරා ගමන් කිරීමේ දී කිසිවකුට අහුන්කන් නොදී තම තනි මතය අනුව ක්‍රියා කිරීම. නාට්‍ය විකාශය වන්නේ ඔහු තම ඉලක්කය කරා ගමන් කිරීමේ දී මුහුණ පාන සියලු ආකාර ගැටලු විසඳමින් ඉදිරියට ගමන් ගැනීම හා තමා ඝාතකයා බවට සැක පහළ වන අවස්ථා තිබුණ ද ඒවා නොතකා තම අරමුණ කරා යාම.

***(ලකුණු 05)***

(iii)

- අවංක ලෙස ම රටට ආදරය කිරීම
- ඍජුව මහජනයාට ආමන්ත්‍රණය කොට ගැටලු සාකච්ඡා කිරීම
- මහජනයාට ආදරය කිරීම
- රට මුහුණ පා සිටින ගැටලුව තමන්ගේ ගැටලුවක් ලෙස සැලකීම
- කළ වරදට දඩුවම් ඉල්ලා සිටීම
- නොපැකිළ ව වරද පිළිගැනීම
- ප්‍රතිඥාවක් දුන් පරිදි ම එය ඉටු කිරීම
- අවංක පාලකයෙක් බව තහවුරු වීම
- රට වැසියා වෙනුවෙන් තම අධ්‍යාශයෙහි ම එල්බගෙන සිටීම

***(ලකුණු 06)***

Department of Examinations - Sri Lanka

**3.** (i) රූකඩ ගෙදර පළමුවැනි අංකය ආරම්භයේ ප්‍රේක්ෂකයාට දෘශ්‍යමාන වන පසුතලය ගැන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04 යි.)

(ii) නාට්‍ය විකාසනයේ දී එම පසුතලය හා නාට්‍යෝපකරණ උපයෝගී වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) නූවුරා ගේ මානසික සට්ටනය පිළිබිඹු කිරීමට ඉබ්සන් උපයෝගී කරගන්නා නාට්‍යෝපක්‍රම විමර්ශනය කරන්න. (ලකුණු 06 යි.)

(i) ආරම්භයේ දකින්නට ලැබෙන්නේ මනස්කාන්ත හා සුව පහසු ලෙස සකස් කළ කාමරයකි. පසු පස බිත්තියෙහි දොරවල් දෙක කි. දකුණු පස දොර සාලයට ද වම් පස දොර හෙල්මගේ කාමරයට ද වේ. වම් පස බිත්තියේ මැද දොරකි. දකුණු බිත්තියේ මැදට වන්නට තවත් දොරකි.

පියානෝව, වට මේසය, ගිනි උඳුන, ඇඳි පුටුව, පැද්දෙන පුටුව යන ගෘහ භාණ්ඩ ප්‍රේක්ෂකයාට දර්ශනය වේ. මේ සියලු දෙයින් සුව පහසු ජීවිතයක් ගත කරන මධ්‍යම පන්තික පවුලක් පිළිබඳ හැඟීමක් ප්‍රේක්ෂකයා තුළ ජනිත වේ.

***(ලකුණු 04)***

(ii)

- නාට්‍ය විකාසනයේ දී නාට්‍යෝපකරණ අර්ථාන්විත ව භාවිතා කරන ආකාරය.
- පියානෝව මධ්‍යම පන්තියේ නිවසක රුචිකත්වය හා ජීවන රටාව නිරූපණය කරයි.
- වට මේසය නාට්‍ය අවසාන භාගයේ නෝරා හා හෙල්මා අතර තීරණාත්මක කතා බහ සඳහා යොදා ගනී.
- නෝරා පැද්දෙන පුටුවේ වාඩි වී සිටීම ඇය ගේ අවිනිශ්චිත මනසේ ස්වභාවය සංකේතවත් කරයි. වරෙක ඇය රන්ක් දෙස මදහසින් යුතුව බලා සිටින්නේ ද මෙම පුටුවේ සිටිය දී ය. එයින් ඇය ලබන සැහැල්ලුව සහනය පෙන්වයි.
- ක්‍රිස්ටීන් සෝපාවෙහි වාඩි කොට නෝරා කුඩා බංකුවක වාඩි වේ. නෝරා හමු වීමෙන් ක්‍රිස්ටීන් ගේ ජීවිතය සුව පහසු වන ආකාරය සහ නෝරා ගේ තත්ත්වය පහතට වැටෙන ආකාරය ඉන් කියැවේ.
- නාට්‍යය ආරම්භ වන්නේ සීනුව නාද වී දොර ඇරෙන හඬිනි. ඉමහත් ප්‍රීතියෙන් නෝරා ඇතුළු වේ. නාට්‍යය අවසානය ඇසෙන්නේ දොර වැසෙන හඩකි. නෝරා ඉන් පිටව යන්නේ ශෝකයෙන් නමුත් නිදහස් මනසකිනි.

***(ලකුණු 05)***

(iii)

- නත්තල් ගස ක්‍රමයෙන් අවුල් වී යාම
- තරන්තලා නර්තනය
- පැද්දෙන පුටුව
- අණ්ඩ දැමූ ඇඳුම

Department of Examinations - Sri Lanka

**නත්තල් ගස**

දෙවැනි අංකය ආරම්භයේ සැරසිලි ගලවාදැමූ නත්තල් ගස පියානෝව අසල මුල්ලක ඇත. නිවී ගොස් ඉතිරි වූ ඉටි පන්දම් කැබලි පමණක් දක්නට ලැබේ. නෝරා ගේ නොසන්සුන් බව ද නත්තල් ගසේ අවුල් වූ අතු මෙනි.

***(මේ ආකාරයට අපේක්ෂකයා ලියා ඇති උපක්‍රම පැහැදිලි කර ඇති විට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. ලකුණු 06)***

**B කොටස**

4. (i) ග්‍රීක නාට්‍ය රචක යුරිපිඩීස් ගේ නාට්‍ය **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)
   (ii) ඔහුගේ නිර්මාණ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)
   (iii) ශෝකාත්මක නාට්‍යකරුවන් අතර යුරිපිඩීස් සුවිශේෂ වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

(i)

| | |
|---|---|
| අල්කීස්ටිස් | ඔරෙස්ටීස් |
| මීඩියා | ඇන්ඩ්‍රොමැකි |
| හිපොලිටස් | ඉලෙක්ට්‍රා |
| ද ට්‍රෝජන් විමෙන් | හෙකබේ |
| බක්බයි | හෙලන් |
| සප්ලයන්ට්ස් | හෙරක්ලීස් |

***(නාට්‍ය තුනක් නම් කිරීම සඳහා ලකුණු 03)***

(ii) යුරිපිඩීස් (ක්‍රි.පූ. 484 - 406) නාට්‍ය 92ක් පමණ ලියා ඇත. නාට්‍ය පිටපත් 19ක් ඉතිරිව පවතී. නාට්‍ය උත්සවවල දී සිව් වතාවක් ප්‍රථම ස්ථානය හිමි කර ගෙන ඇත.

- ප්‍රසිද්ධ ග්‍රීක පුරාවෘත්ත පසුබිම් කරගෙන නාට්‍ය ලියා ඇත. එහෙත් යුරිපිඩීස් තම අභිප්‍රායට සුදුසු පරිදි පුරාවෘත්ත වෙනස් කොට තම නාට්‍ය ඉදිරිපත් කරයි.
- ඔහු ගේ නාට්‍යවල පූර්ව රංගයේ (Prologue) දෙවිවරු පෙනී සිටිති.
- නාට්‍යවල එන චරිත රාගය, මාත්සර්යය, බද්ධ වෛරය, පළිගැනීමේ චේතනාව වැනි අරමුණු ඇතිව කටයුතු කරයි.
- තියුණු ආවේගවලින් ඇලළුණු ස්ත්‍රී චරිතවල ගතිසොබා මතු කොට දක්වයි. මීඩියා නාට්‍යයේ මීඩියා පළිගැනීමේ චේතනාවෙන් වියරු වැටී ඒ සිතුවිල්ලේ ම එල්බගෙන කටයුතු කරන්නියකි. හිපොලිටස් නාට්‍යයෙහි ෆ්‍රීඩා රාග චිත්තයෙන් දැඩි සේ වෙළී ඒ අනුව කටයුතු කරන්නී ය. ඔරෙස්ටීස් නාට්‍යයේ ඉලෙක්ට්‍රා සිය පියා මැරූ පළිය ගැනීමේ උමතුවෙන් කටයුතු කරන චරිතයකි.
- සෑම නාට්‍යයකින් ම මානව සබඳකම් විවරණය කරයි. විදේශිකයන්, ස්ත්‍රීන් හා අවජාතක දරුවන් අත්විඳි දුක් ගැහැට මීඩියා නාට්‍යයෙන් නිරූපණය වේ. හිපොලිටස් දුක් විඳින ස්ත්‍රී චරිතයක් කේන්ද්‍ර කොටගෙන ලියා ඇත.

Department of Examinations - Sri Lanka

- ට්‍රෝජන් ගැහැණු, යුද්ධයේ බිහිසුණු බව, අමානුෂික බව හා එයින් සිදුවන මහා විනාශය පෙන්වා දෙන නාට්‍යයකි. එය යුද විරෝධී නාට්‍යයක් ලෙස සැලකේ.

***(මෙවැනි කරුණු 3ක් ලියා ඇත්නම් ලකුණු 06)***

(iii) ශෝකාත්ම නාට්‍යකරුවන් අතර යුරිපිඩීස් සුවිශේෂ වන්නේ ප්‍රගතිශීලී අදහස් දැරූ කවියෙකු වීම, විප්ලවකාරී චින්තකයෙකු වීම, විතණ්ඩවාදී මතවාදවලට නැඹුරු වී එකල සමාජයේ පැවති දුර්වලතා, පුහු මත හා විශ්වාස විවේචනය කිරීම.

- යථාර්ථවාදී නාට්‍ය කලාවේ ආරම්භකයා වීම
- පුරාණෝක්තිය සිය දර්ශනය අනුව අර්ථ කථනය කිරීම
- ශෝකාත්ම නාට්‍ය ආකෘතිය වෙනස් කිරීම
  තර්කානුකූලව මුල - මැද - අග ගොඩ නංවන නාට්‍ය ආකෘතිය බැහැර කළේය.
- දේවත්වය හා වීරත්වය ඇසුරු කළ ශෝකාත්මක නාට්‍යයට මානුෂික ස්වරූපයක් දීම
- පූර්ව කථනයේ දී නාට්‍යයේ චරිතයක් හෝ බාහිර දෙවියකු මගින් කතාවේ සාරාංශය ඉදිරිපත් කිරීම
- ගායන වෘන්දය සාමාන්‍ය පුද්ගලයන්ගෙන් සැදුම් ලත් එකක් බවට පත් කිරීම
- ග්‍රීක පුරාණෝත්තිවල එන කාන්තා චරිතවල ආශාවන්, අභිප්‍රාය යථාර්ථවාදී ලෙස නිරූපණය කිරීම
- මිනිස් චෛතසිකය ගැඹුරින් විග්‍රහ කිරීම (උදා: හිපොලිටස් නාට්‍යයේ ෆීඩා)
- ස්ත්‍රී අධ්‍යාත්මයේ ස්වභාවය නිරූපණය කිරීම
- ස්කිනි ගොඩනැගිල්ල රංග කාර්ය සඳහා යොදා ගැනීම (උදා: ඔරෙස්ටීස් නාට්‍යයේ බිය ගුල්ලකු මාලිගයෙන් පැන යාම සඳහා මාලිගය වහල ලෙස යොදා ගත්තේ ස්කිනි ගොඩනැගිල්ලේ වහලයි.)
- චක්‍ර මංචය හා එක්කුලීමා උපකරණ නාට්‍ය රඟ දැක්වීමට භාවිත කළේය
- නාට්‍ය අවසන් කිරීමට නොහැකි වූ විට දෙවියකු යන්ත්‍රයකින් බස්සවා එය නිම කිරීමේ සම්ප්‍රදාය ඇරඹුවේ ය.

***(මෙවැනි කරුණු 3ක් වත් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 06)***

5. (i) එළිසබෙතීන යුගයේ පැවැති රංගශාලා **හතරක** නම් ලියන්න. (ලකුණු 02 යි.)
(ii) එළිසබෙතීන රඟහලක සැලැස්ම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
(iii) එළිසබෙතීන යුගයේ නාට්‍යයකින් නිදසුන් දක්වමින් නාට්‍යයක් රඟ දැක්වීමේ දී රඟහල භාවිත කළ අයුරු විස්තර කරන්න. (ලකුණු 07 යි.)

(i)

- Globe ග්ලෝබ්
- Swan
- Curtain
- Fortune
- Red Bull

***(ලකුණු 02)***

Department of Examinations - Sri Lanka

(ii)




<u>**ග්ලෝබ් රඟහල**</u>

මෙය ප්‍රේක්ෂකයන් 2000කට පමණ ඉඩ පහසුකම් ඇති අටපට්ටම් හැඩැති තෙමහල් ගොඩනැගිල්ලකි. මෙම වේදිකාව ප්‍රධාන කොටස් පහකින් (5) සමන්විත වේ.

- ඉදිරියට නෙරා ගිය ප්‍රධාන වේදිකාව - මෙය ඒප්‍රණයක හැඩයෙන් යුක්ත වේ. එහි ඉදිරිපස පළල අඩි 24ක් වන අතර පසු පස කොටස අඩි 43ක පළලකින් යුක්ත වේ. මෙම ඒප්‍රණ වේදිකාව වටා අත්වැටකි. පොළොවේ සිට අඩි 4ක් පමණ උසින් වේදිකා තලය පිහිටා ඇත.

- උමං දොරටු - වේදිකාව මධ්‍යයේ විශාල උමං දොරටුවක් පිහිටා ඇත. ඒ ඔස්සේ ක්ෂණික ව අවතාර වැනි චරිත වලට වේදිකාවෙන් පිට වීමටත් පුළුවන.

- අභ්‍යන්තර වේදිකාව (අධ්‍යයනාගාරය) - ඒප්‍රණ වේදිකාවට පිටුපසින් පිහිටි මෙහි ඉදිරිපස තිරයක් වේ. මෙම අභ්‍යන්තර වේදිකාව පළල අඩි 23කින් ද අඩි 8ක් පමණ ගැඹුරකින් ද යුක්ත ය. මෙම කොටස 'ආචාර්ය ෆෝස්ටස්' නාට්‍යයේ අධ්‍යයනාගාරයක් (Study room) වශයෙන් ද 'හැම්ලට්' නාට්‍යයේ ගර්භ නාටකය රංගගත කිරීම සඳහා ද 'ද ටෙම්පස්' නාට්‍යයේ ගුහාවක් ලෙස ද භාවිතා කර ඇත.

- උපරි වේදිකාව - අභ්‍යන්තර වේදිකාවට ඉහළින් මෙය පිහිටා ඇත. එහි ඉදිරිපස කොටස අඩි 3ක් පමණ ඒප්‍රණ වේදිකාව දෙසට නෙරා තිබේ. එය සඳළුතලයකට සමාන ය. රෝමියෝ ජුලියට් නාට්‍යයේ රෝමියෝ, රාත්‍රී කාලයේ දී ජුලියට් හමු වන සඳළුතලය වන්නේ මෙම උපරි වේදිකාව යි.

- නිරය (Hell) - ඒප්‍රණ වේදිකාවට යටින් පිහිටි බිම් කිළිය 'නිරය' ලෙස හැඳින්වේ. එහි පිහිටි උමං දොරටුව ඔස්සේ අවතාරවලට ඒප්‍රණ වේදිකාවට පිවිසීමටත් ඉන් පිටවීමටත් හැකි ය.

***(ලකුණු 06)***

Department of Examinations - Sri Lanka

(iii)

- නාට්‍ය දර්ශනයක ආරම්භය වන්නේ හොරණෑ නාදයකින් බවත් දිගු කලු කබායකින් සැරසුණු නළුවෙක් වේදිකාවට පැමිණ පූර්ව කථනය කියවන බව
- ශෝකාත්ම නාට්‍යයක දී වේදිකාව කළු පැහැ වස්ත්‍ර වලින් ද සුඛාත්ම නාට්‍යයක දී නිල් පැහැ වස්ත්‍රයෙන් ද සැකසූ තිර රෙදි භාවිතා කර ඇති බව
- නාට්‍ය දර්ශනයට පසුබිම් වන ස්ථානය කුමක් දැයි සඳහන් පුවරු වේදිකාවේ දොරටුවක එල්ලා තිබූ බවත් ස්ථාන මාරු වීමත් සමග වෙනත් පුවරු එල්ලීමක් කර ඇත.
- තෙමහල් අටාස්‍රාකාර ගොඩනැගිල්ලක් වූ ග්ලොබ් රඟහල ප්‍රධාන කොටස් පහකි. එම කොටස් පහ සිසුවා තෝරාගත් නාට්‍යය ඇසුරෙන් භාවිතා කරන ආකාරය විස්තර කර තිබිය යුතු ය.
- උමං දොරටු භාවිතා කිරීම
- ස්වර්ගය ලෙසින් හැඳින්වෙන වේදිකා වියන රඳවා ඇති කුළුණු භාවිත කරන අයුරු
- අභ්‍යන්තර වේදිකාව භාවිතය (අධ්‍යයනාගාරය)
- අධ්‍යයනාගාරයට මත්තෙන් වූ උපරි වේදිකාව භාවිතා කරන ආකාරය (සඳළු තලය)
- ඒප්‍රණ වේදිකාවට යටින් වූ නිරය භාවිතා කිරීම (උමං දොරටු ඔස්සේ ඒප්‍රණ වේදිකාවට පිවිසීම)
- මඩු ලෙස හැඳින්වෙන ගොඩනැගිලි දෙක භාවිතය (ශබ්ද සඳහා)
- සංගීතය සපයන්නන් සඳහා සංගීතාගාරය
- කවුළු වේදිකා භාවිතය මෙහිදී ශිෂ්‍යයා තෝරා ගත් නාට්‍යය මේ ස්ථාන ඔස්සේ භාවිතයට ගැනීම විවරණය කර ඇත්නම්

*(ලකුණු 07)*

**6.** (i) නාට්‍ය කලාවට අදාළ ආනුෂංගික කලා **හයක්** හඳුන්වා දෙන්න. (ලකුණු 03 යි.)
(ii) ඉන් **එකක්** නාට්‍යෝචිත ව භාවිත කරන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 06 යි.)
(iii) ආනුෂංගික කලා අයත් වන්නේ කුමන අභිනයට දැ යි සඳහන් කොට විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(i)

- රංගාලෝකය
- සංගීතය
- අංගරචනය
- වේෂභූෂණ
- වේදිකා පසුතල
- රංග උපකරණ
- රංග වින්‍යාසය

*(ලකුණු 03)*



Department of Examinations - Sri Lanka

(ii) මෙහිදී ශිෂ්‍යයා තෝරා ගත් ආනුෂංගික අංගය නාට්‍යෝචිතව භාවිතා කරන ආකාරය අවධාරණය කර තිබිය යුතු ය. නාට්‍යයේ ශෛලිය

- යුගය, කාලය
- අවස්ථාව තීව්‍ර කිරීම
- පරිසරය හා සමාජ තත්වය
- නාට්‍ය වින්‍යාසයට, තේමාවට ගැළපෙන බව
- ක්‍රියා විකාශයට, නාට්‍යයේ පිටපතට ගැළපෙන බව
  උදා : ළමා නාට්‍යයක නම් සරල බව
  යොවුන් නාට්‍යයක නම් යොවුන් මනසට ගැලපීම
- සංකේත භාවිතා කළ යුතු අවස්ථාවල දී

***(ආදි ලෙසින් ශිෂ්‍යයා නාට්‍යෝචිත ව භාවිතා කර ඇති ආකාරය තාර්කික ව ලියා ඇත්නම් ලකුණු 06ක්)***

(iii) ආනුෂංගික කලා අයත් වන්නේ ආහාර්ය අභිනයට ය.

***(නාට්‍ය නිර්මාණය සඳහා යොදාගන්නා සියලු ආනුෂංගික කලාවන් පිළිබඳව ප්‍රමාණවත් පරිදි විස්තර කිරීම සඳහා ලකුණු 06)***

Department of Examinations - Sri Lanka